
# රණවිරුවා

2024 ජූලි • 268 කලාපය



## රණවිරු දෑතින් එළිය කෙරූ බුදුන් වැඩි පුදබිම

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# දීඝවාපි මහා සෑයේ සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කෙරේ

ශ්‍රී ලාංකික උරුමයක් ලෙස සැලකෙන ඓතිහාසික දීඝවාපි මහා සෑයේ සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමේ පූජෝත්සවය අතිගරු ජනාධිපති හා සන්නද්ධ හමුදා සේනාධිනායක රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ජූලි මස 14 වන දින සිදුකෙරිණ. එම අවස්ථාවට ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ එතුමන්ගේ භාර්යාව වන චිත්‍රානි ගුණරත්න මහත්මිය, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු සම්භාවනීය ආරාධිතයින් සහ බැතිමතුන් රැසක් සහභාගී වූහ.

එහිදී, එම විහාරස්ථාන පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ දාන ශාලාව සහ ධාතු මන්දිරය විවෘත කිරීම ද ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරිණ. මෙම දාන ශාලාවේ ඉදිකිරීම් කටයුතු සඳහා නාවික හා ගුවන් හමුදා භටපිරිස් ශ්‍රම දායකත්වය සැපයූහ. අනතුරුව, දීඝවාපිය විහාරස්ථානයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය මහඔය සෝභිත හිමිපාණන් ඇතුළු මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ යුද්ධ හමුදා භටපිරිස්හි සහභාගීත්වයෙන් චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ධාතු ගර්භයේ සර්වඥ ධාතූන් සහ නිධන් වස්තු තැන්පත් කරනු ලැබීය.

මෙම අවස්ථාවට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්, බුද්ධශාසන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මැතිතුමන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, නාවික සහ ගුවන් හමුදාධිපතිවරු, පොලිස් නිලධාරීන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් ද ප්‍රදේශවාසී බැතිමතුන් විශාල පිරිසක් ද සහභාගී වූහ.

අතිපූජ්‍ය දරණාගම කුසලධම්ම නාහිමිපාණන්ගේ මැණියන් විසින් ලබාදුන් මූල්‍ය දායකත්වය මත නාවික හා යුද හමුදා භටපිරිස් විසින් ඉදිකරන ලද දරණාගම කුසලධම්ම නාහිමි අනුස්මරණ සන්ථාගාර ශාලාව විවෘත කිරීම ද එහිදී උන්වහන්සේගේ මැණියන්ගේ සුරතින් සිදුවිය.










# නීලගිරි මහා සෑයේ සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කෙරේ



නීලගිරි මහා සෑයේ සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමේ උත්සවය ඉකුත් ජූලි මස 15 වන දින බැතිමතුන් විශාල පිරිසකගේ සාධු නද මධ්‍යයේ සිදුකෙරිණ. ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සමඟින් එතුමන්ගේ භාර්යාව වන චිත්‍රානි ගුණරත්න මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූහ. පූජ්‍ය කහගොල්ලේ සෝමවංශ හිමියන් මුලසුන හෙබවූ මෙම පූජෝත්සවය සඳහා මහා සංඝරත්නය, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී, ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, ප්‍රදේශවාසී බැතිමතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.










# වීරමාතා උපහාර උළෙල

මාතෘ භූමියේ ඒකීයත්වය, ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව උදෙසා සටන් වැද සුවිශේෂී දක්ෂතා දක්වමින් තම ප්‍රාණ දානය පුදකර "පරම වීර විභූෂණ" *(PWV)* සහ "වීර වික්‍රම විභූෂණ" *(WWV)* ගෞරව සම්මානයෙන් පුද ලද රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් ඇගයීම වෙනුවෙන් "වීර මාතා උපහාර උළෙල" නමින් වැඩසටහනක් යුද්ධ හමුදා මූලස්ථානයේදී පසුගියදා පැවැත්විණ.

ඉකුත් ජූලි මස 12 වන දිනට යෙදුණු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 40 වන සංවත්සරයට සමගාමීව ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ ආරක්ෂක අමාත්‍යාංශ සේවා වනිතා ඒකකයේ සභාපතිනි චිත්‍රානි ගුණරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ද සහභාගී වූහ. එහිදී, සක්‍රිය සේවයේ යෙදී සිටියදී සතුරාට මුහුණ පා සිය සහෝදර සොල්දාදුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙන් තම දිවි පරිත්‍යාග කර "පරම වීර විභූෂණ" පදක්කම්ලාභී රණවිරුවන් වෙනුවෙන් ඔවුන් නියෝජනය කරමින් පැමිණි ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙත ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් විශේෂ පදක්කම්, මූල්‍යාධාර සහ සමරු ඵලක පිරිනැමිණ.









# ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක්






යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූලි මස 05 වන දින ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිල සංචාරයක නිරත විය. පාබල අධ්‍යක්ෂ ජෙනරාල් සහ ගැමුණු හේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයේ ගෞරවාචාරය ද පුදකෙරිණ. අනතුරුව, එතුමන් එහි රණවිරු ස්මාරකය අභියසදී දිවිපිදූ රණවිරුවන් වෙත පුෂ්පෝපහාරය පුදකරන්නටද එක්විය.

සිය සංචාරයේදී එම භටපිරිස් ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති විනය සහ පක්ෂපාතීත්වය පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළ අතර, රාජකාරී ඉටුකිරීම සහ තම රාජකාරියට වගවීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වාගැනීම සඳහා ඔවුන් දිරිමත් කළේය. මීට අමතරව, සමාජ මාධ්‍යයන්හි යුද්ධ හමුදාව හා සබැඳි වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම පිළිබඳව ද පෙන්වා දුන්නේය. එමෙන්ම, එම රෙජිමේන්තු ක්‍රීඩා පිටියේ අභිනවයෙන් ඉදිකළ ක්‍රීඩාගාරය විවෘත කිරීමට ද එක්වූ යුද්ධ හමුදාධිපති එහි සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සහ ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකළේය. තවද, භටපිරිස් සමඟ තේ පැන් සංග්‍රහයකටද එක් වූ හෙතෙම ඔවුන් හා සුහද කතාබහක යෙදෙන්නටද අමතක නොකළේය.



# යුද්ධ හමුදා රෝහලේ නිරීක්ෂණ චාරිකාවක







යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූලි මස 18 වන දින නාරාහේන්පිට පිහිටි යුද්ධ හමුදා රෝහලේ සංචාරයක නිරත විය. රෝහල් පරිශ්‍රය වෙත සැපැමිණි යුද්ධ හමුදාධිපති එහි කාර්ය නියුතු යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රිගේඩියර් ඩබ්ලිව්එච්ඩබ්ලිව් වීජේරත්න, යුද්ධ හමුදා රෝහලේ කළමනාකරණ සහ නඩත්තු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්ජේබී රත්නායක ආර්එස්පී, යුද්ධ හමුදා රෝහලේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්එම් මොණරාගල යූඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.

මෙම සංචාරයේදී යුද්ධ හමුදාධිපති වාට්ටු අංක 05, 08, 09, 15, 16, 17, 18, බෙහෙත් ශාලාව ඇතුළු විවිධ අංශ සහ නවාතැන් පහසුකම් සඳහා වෙන්කර ඇති සෙසු නිල හටනිවාස, බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය නිරීක්ෂණය කළේය. එසේම, සෙසුනිල මුළුතැන්ගෙය, මෝටර් රථ ප්‍රවාහන අංශය සහ රෝගීන්ගේ සලාක ගබඩාව ද නිරීක්ෂණය කළ ඔහු රෝගීන් සඳහා ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා එහි නිසි ක්‍රියාකාරීත්වය ද සොයාබැලීය. තවද, රෝහලේ පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරමින් පවතින මහල් 15 කින් යුත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ද එතුමාගේ නිරීක්ෂණයට බඳුන්විය.

මෙහිදී, යුද්ධ හමුදාධිපති එම රෝහලේ සියලු නිලයන් අමතන්නට ද අමතක නොකළේය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී, යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් සීඑස් මුණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මේජර් ජෙනරාල් එස්එන්ජේ ආරියසේන ඇතුළු ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ද සහභාගී වූහ.



# නව දඹුලු තාක්ෂණික ව්‍යාපෘති සමාරම්භයට යුද්ධ හමුදාධිපති ද එක්වේ



කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නව දඹුලු තාක්ෂණික ව්‍යාපෘති මණ්ඩපයේ සමාරම්භක උත්සවය පසුගිය ජූලි මස 21 වන දින දඹුල්ලේදී පැවැත්විණි. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති රියර් අද්මිරාල් එච්ජීයූඩී කුමාර, වීඑස්වී, යූඑස්පී, පීඑස්සී, එම්මැරිටයිම්පොල්, බීඑස්සී (ඩීඑස්) (Rear Admiral HGUD Kumara, VSV, USP, psc, MMaritimePol, BSc (DS) ගේ ආරාධනයෙන් මෙම උත්සවයට ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් ප්‍රධානත්වය දැරීය. තවද, මෙම අවස්ථාවට ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆීල් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූහ.







එහිදී, රැස්ව සිටි පිරිස ආමන්ත්‍රණය කළ ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් ජාතියේ තරුණ තරුණියන්ගේ සහ ආරක්ෂක අංශ සාමාජිකයන්ගේ අනාගතය හැඩගැස්වීමේදී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වැනි අධ්‍යයන ආයතනවල තීරණාත්මක කාර්යභාරය ඇගයීය. එසේම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේදී මෙන්ම රටේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීමේදී මෙම ආයතනයෙහි වැදගත්කම පිළිබඳව ද එතුමන් අවධාරණය කළේය. මෙම උත්සව අවස්ථාව සඳහා මාතලේ දිසාපති, ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති, 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.



# සන්නාහ සන්නද්ධ සම්මන්ත්‍රණය 2024



"සන්නාහ සන්නද්ධ සම්මන්ත්‍රණය - 2024", "අනාගත ප්‍රත්‍යන්ත සකස් කිරීම ඇගයීම සහ නවෝත්පාදන හරහා සන්නාහ සන්නද්ධ බලකාය සවිබල ගැන්වීම" (Forging Future Frontiers : Empowering Armor through Evaluation and Innovation) තේමාව මුල්කර ගනිමින් ඉකුත් ජූලි මස 19 වන දින රොක් හවුස් කඳවුරේදී පැවැත්විණ. ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිපී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ඇරයුමෙන් සම්භාවනීය අමුත්තන් ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූහ.

එම බලකායේ සටන් බලය ඇගයීම, තාක්ෂණික දියුණුව ගවේෂණය කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව හා මානව සාධක වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සබැඳිව නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම මගින් අනාගත ජාතික ආරක්ෂාවට බලපාන තර්ජන වලක්වා ගැනීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සම්භාවනීය අමුත්තන් රැසක් ද සහභාගී වූහ.



# යුද්ධ හමුදාධිපති ගේ සුරතින් නව නිවසක් පරිත්‍යාග කෙරේ







එළැඹෙන ඔක්තෝම්බර් මස 10 වන දිනට යෙදෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වැනි සංවත්සරයට සමගාමීව නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් අභිනවයෙන් ඉදිකරන ලද නිවසක් යුද්ධ හමුදාපති හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් පසුගිය ජූලි මස 27 වන දින එච්.ජී. සුසිලා නවරත්න යන මහත්මිය වෙත පවරා දෙනු ලැබූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීජ්අයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ මගපෙන්වීම යටතේ 3 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඒඩීඑච්එම් නුවන් යූඑස්පී එල්එස්සී ගේ අධීක්ෂණය යටතේ එම ඒකක භට පිරිස් මෙම නව නිවස ඉදිකිරීමට ශ්‍රමදායකත්වය ලබාදුන්හ.

මේ සඳහා අනුර බණ්ඩාර, සමන්ති කුමාරි, අනුලා කුමාරිහාමි, රංබණ්ඩාර සහ මුතු මැණිකා කුමාරිහාමි යන මහත්ම මහත්මීහු ඉඩම පරිත්‍යාග කරන ලද අතර, තවත් පුද්ගලයන් රැසකගේ සහාය ද ඊට හිමිවූහ.



# සෙවණක් සදන්නට දිරියක් වෙමින්







නව නිවාස ඉදිකිරීමටත්, අර්ධ වශයෙන් ඉදිකරනු ලැබූ නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු නිමකිරීම සඳහාත් යුද්ධ හමුදා සාමාජිකයින් වෙත මූල්‍ය දිරිදීමනා ප්‍රදානය කිරීම වෙනුවෙන් සංවිධානය කෙරුණු උත්සවයක් ඉකුත් ජූලි මස 23 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් සීඑස් මුණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී සහ රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජ්එස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ඇරයුමෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

රණසේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් කළමනාකරණය වන රණවිරු නිවාස අරමුදලේ 9 වන අදියර යටතේ එහිදී නව නිවාස 15 ක් සඳහා මූල්‍ය ප්‍රදානයන් සිදුකළ අතර, එසේම අර්ධ වශයෙන් ඉදිකරනු ලැබූ නිවාස 105 ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහාද මෙහිදී යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය හිමිවිය. මේ යටතේ නව නිවසක් ඉදිකිරීම සඳහා අරමුදල් ලබන සෑම ප්‍රතිලාභියකුටම රුපියල් මිලියන 1.5 ක් වෙන් කෙරෙන අතර අර්ධ වශයෙන් ඉදිකර ඇති යුද්ධ හමුදා සාමාජිකයන්ගේ නිවාස ඉදිකිරීම් කටයුතු නිමකිරීම සඳහා රු. 750,000 බැගින් ද හිමිගැන්වේ.

මෙම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති සමඟින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී එක්ව ප්‍රතිලාභීන් 40 දෙනකු වෙත සංකේතාත්මකව මුදල් ප්‍රේෂණපත් පිරිනමනු ලැබූහ. රණක්ෂිතයට පත් හා සේවයේ නියුතු, විශ්‍රාමික සහ දිවංගත රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් නව නිවෙස් හිමිකරදීමේ අරමුණින් රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් 2015 වර්ෂයේ සිට මෙම රණවිරු නිවාස අරමුදල ක්‍රියාත්මක කරනු ලබයි. වැඩසටහන ආරම්භයේ සිට මෙම අරමුදල තුළින් නව නිවාස 309 ක් ඉදිකිරීමට සහ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස 223 ක ඉදිකිරීම් කටයුතු නිම කිරීමට හැකියාව ලැබී ඇත.

# මනුසත් දෙරණ
## එක්ව් සුබසාධන
# ව්‍යාපෘති මාලාවක්



"දෙරණ" මාධ්‍ය ජාලය මඟින් ක්‍රියාත්මක කරන මනුසත් දෙරණ සුබසාධන ව්‍යාපෘතියේ 72 වන වැඩසටහන ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා වනිතා ශාඛාවේ සහයෝගයෙන් ගලේවෙල සිල්වත්ගල මහා විද්‍යාලයේදී පසුගිය ජූලි මස 27 වන දින දියත් කරන ලදී. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සමඟින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධානත්වය දැරූ එම වැඩසටහනේදී ප්‍රදේශවාසීන් සඳහා ප්‍රජා සත්කාරක වැඩසටහන් රැසක් පැවැත්විණ.





මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස මොරගොල්ල මහා විද්‍යාලයට සහ සිල්වත්ගල මහා විද්‍යාලයට ක්‍රීඩා උපකරණ කට්ටල පරිත්‍යාග කිරීමද ඇක්වාලයිෆ් වෝටර් සමාගම විසින් හොම්බාව මහා විද්‍යාලයට ජල පෙරන යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමද සිදුවිය. එහි දෙවන අදියරේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ බලකාධිපති සමඟින් එම සේවාවනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය ප්‍රදේශයේ තෝරාගත් දුෂ්කර පාසල් 08 ක සිසු සිසුවියන් 150 දෙනකු සඳහා පාසල් පාවහන් ප්‍රදානය කළහ. මේ සඳහා එම සේවාවනිතා ශාඛාවේ සාමාජිකාවෝ සහ පරිත්‍යාගශීලීහු දායක වූහ.




තවද, නොමිලේ ඇස් කණ්ණාඩි බෙදාදීමක් ද යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ පරිත්‍යාගශීලීන් විසින් ගර්භනී මව්වරු වෙනුවෙන් වියළි සලාක පාර්සල් පරිත්‍යාග කිරීමක් ද ග්‍රාමසේවක කොට්ඨාස මට්ටමින් තෝරාගත් අවශ්‍යතා සහිත පවුල් 400 ක් සඳහා වියළි සලාක පාර්සල් බෙදාදීමක් ද වැඩසටහනට ඇතුළත් විය.

මීට අමතරව සිල්වත්ගල මහා විද්‍යාලයට රුපියල් 300,000.00 ක් වටිනා සංගීත භාණ්ඩ පරිත්‍යාගයක් ද සිදුකෙරිණ. එසේම, එම විද්‍යාලයේ ප්‍රතිසංස්කරණය කරන ලද සංගීත කාමරය සිසු අයිතියට පත්කිරීම ද සිදුවිය. 5 වන යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරිගේ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා ශ්‍රම දායකත්වය සහ මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙමින් මෙම සංගීත කාමරය ප්‍රතිසංස්කරණය කරන ලදී. අනතුරුව යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය එම විදුහලේ විදුහල්පති සමඟින් පාසල් පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් ඊට සහභාගී වූ ප්‍රදේශවාසීන් සමඟ සිය අදහස් බෙදාගන්නටද අමතක නොකළහ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවාවනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, දෙරණ ටීවී මනුසත් දෙරණ වැඩසටහනේ සාමාජිකයන්, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, පරිත්‍යාගශීලීන් හමුදා සාමාජිකයින්, රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානීන්, පාසල් කාර්ය මණ්ඩලය සහ සිසුන් මෙන්ම ප්‍රදේශවාසීහු විශාල පිරිසක් සහභාගී වූහ.





# අන්තර් රෙජිමේන්තු රග්බි ශූරතාවලිය

# 2024

කණ්ඩායම 14ක සහභාගීත්වයෙන් ඉකුත් ජූනි මස 11 වන දිනෙන් ඇරඹි යුද්ධ හමුදාධිපති කුසලාන අන්තර් රෙජිමේන්තු රග්බි ශූරතාවලියේ අවසන් මහා තරඟය කොළඹ තුරඟ තරඟ පිටියේදී ඉකුත් ජූලි මස 30 දින අවසන් විය.

එම තරඟයේදී ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායට එරෙහිව ගජබා රෙජිමේන්තුව තරඟ වැදුණු අතර, එහිදී උණුසුම් තරඟයකින් අනතුරුව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා කණ්ඩායම ලකුණු 14-0 ක් ලෙස අන්තර් රෙජිමේන්තු රග්බි ශූරතාව හිමිකර ගැනීමට සමත්විය.





ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති සහ යුද්ධ හමුදා රග්බි කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ. තරඟාවලියේ දක්ෂතම රග්බි ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලකායේ ලාන්ස් කෝප්‍රල් සාලින්ද එච්ඒන්ජී තේරී පත් විය. අවසන් මහා තරඟය නැරඹීමට ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සෙබළුන් ඇතුළු ප්‍රේක්ෂකයෝ විශාල පිරිසක් සහභාගී වූහ

# ඔලිම්පික් වරම් ලද විරුවන් යුද්ධ හමුදාධිපතිගේ ඇගයුමට





පැරිසියේ පැවැත්වෙන "ඔලිම්පික් ක්‍රීඩා උළෙල - 2024" සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්තිමත් ක්‍රීඩකයින් දෙදෙනකු වෙත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූලි මස 23 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලය වෙත ආරාධනා කරනු ලැබූහ.

මාණ්ඩලික සැරයන් අරුණ දර්ශන එළඹෙන පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළලේ මීටර් 400 ඉසව්ව සඳහා නිල වශයෙන් සිය ස්ථානය මේ වනවිට තහවුරු කර ඇති අතර, එමෙන්ම, හෙල්ල විසි කිරීමේ ඉසව්ව තුළින් ලෝක මළල ක්‍රීඩා ශ්‍රේණිගත කිරීම මත පදනම්ව 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළලේ සිය ස්ථානය තහවුරු කරගැනීමට මාණ්ඩලික සැරයන් දිල්හානි ලේකම්ගේ සමත් වී ඇත. මේ වනවිට ලෝක ශ්‍රේණිගත කිරීම්වල 26 වන ස්ථානයේ පසුවන ඇය ඔලිම්පික් හෙල්ල විසිකිරීමේ ඉසව්ව සඳහා සුදුසුකම් ලැබූ හොඳම ක්‍රීඩිකාවන් 32 දෙනා අතරට ද පැමිණ සිටියි.

මෙම සුහද හමුවේදී, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිය කැපවීම, පුහුණුව සහ නොපසුබට උත්සාහය තුළින් තම ඉසව්වන්හි ස්ථාන තහවුරු කරගනිමින් යුද්ධ හමුදාවටත්, රටටත් ගෞරවයක් අත්කරදීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපති ඔවුන් වෙත සිය ප්‍රශංසාව පුදකළේය. එසේම, එළඹෙන ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සූදානම් වීමේදී ඔවුන්ට අවශ්‍ය පූර්ණ සහයෝගය සහ දිරිගැන්වීම් ලබාදෙන බවට ද සඳහන් කළ යුද්ධ හමුදාධිපති ඔවුන් දිරිමත් කිරීම සඳහා මූල්‍ය ප්‍රදානයන් ද සිදුකළේය.



දිවංගත කර්නල් ෆස්ලි ලෆීර් පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ භාර්යාව වන අනෝමා ලෆීර් මහත්මිය ඉකුත් ජූලි මස 25 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූවාය. 1996 ජූලි මස 18 වන දින එල්.ටී.ටී.ඊ විසින් වටලනු ලැබූ මුලතිව් හමුදා කඳවුර මුදාගැනීමේ මෙහෙයුමේ දී එතුමියගේ සැමියා මව්බිම වෙනුවෙන් සිදුකළ වීරෝදාර පරිත්‍යාගය පිළිබඳ යුද්ධ හමුදාධිපති මෙම හමුවේදී ඉමහත් ගෞරවයෙන් සිහිපත් කළේය.

# අනෝමා ලෆීර් මහත්මිය යුද්ධ හමුදාධිපති හමුවෙයි



මුලතිව් හමුදා කඳවුර ගලවා ගැනීමේ මෙහෙයුමට නායකත්වය ලබාදීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ එතුමන් සතුරු ප්‍රහාර මධ්‍යයේ ගුවනින් ගොඩබැස මියෙන මොහොත තෙක්ම තම භටපිරිස් වෙත නායකත්වය ලබාදුන්නේය. තම සහෝදර සොල්දාදුවන් 1500 කගේ පමණ ජීවිත ආරක්ෂා කිරීම උදෙසා එතුමන් එම ක්‍රියාන්විතයේ දී මව්බිම වෙනුවෙන් සිය ජීවිතය පූජාකිරීම හේතුවෙන් ත්‍රිවිධ හමුදා සාමාජිකයකුට පිදෙන ඉහළම සම්මානය වන "පරම වීර විභූෂණ" (PWV) සම්මානයෙන් පිදුම් ලැබීය. මෙම හමුවේදී දිවංගත කර්නල් ෆස්ලි ලෆීර් පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉටු කරන ලද අසමසම සේවාව අගයමින් අනෝමා ලෆීර් මහත්මිය වෙත යුද්ධ හමුදාධිපති විසින් සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# ඉන්දීය හමුදා නියෝජිත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති



10 වන ඉන්දියානු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික සාකච්ඡාවට සමගාමීව, මේජර් ජෙනරාල් සීඑස් දෙව්ගන් වයිඑස්එම් ඒඩීජී එම්අයි (ඒ) (*C'S Dewgun YSM" ADG MI (A)*) ගේ ප්‍රධානත්වයෙන් යුත් සිව් පුද්ගල ඉන්දීය හමුදා දූත පිරිසක් ඉකුත් ජූලි මස 9 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ.

එම පිරිසට කර්නල් නිතින් යාදවා (*Colonel Nitin Yadava*), කර්නල් ඩීසීඩී (ඒ), ඉන්දීය නාවික හමුදාවේ කපිතාන් එම් ආනන්ද් (*Captain M' Anand*) සහ ලුතිනන් කර්නල් මන්දීප් සිං නෙගී එස්එම් (*Lieutenant Colonel Mandeep Singh Negi SM*) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ඇතුළත් වූහ. මෙම සුහද හමුවේදී වසර ගණනාවක් මුළුල්ලේ දෙරටෙහි ත්‍රිවිධ හමුදා අතර පවතින සහයෝගීතාවය තවදුරටත් ප්‍රවර්ධනය කරගැනීමේ සහ පුහුණු වැඩසටහන් හුවමාරු කරගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව යුද්ධ හමුදාධිපති අවධාරණය කළේය.

# ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සභාපති යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ 16 වන සභාපති ධූරයේ රාජකාරී භාරගත් ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික) ඉකුත් ජූලි මස 09 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම හමුවේදී, ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය වෙනුවෙන් එම භටපිරිස්හි දායකත්වය පිළිබඳව ආවර්ජනය කළ යුද්ධ හමුදාධිපති ඔවුන්ගේ පරිපාලන සහ සුභසාධන කටයුතු වෙනුවෙන් විසඳුම් ලබාදීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. එමෙන්ම, එම සාමාජිකයින් වෙනුවෙන් පෙනීසිටීමේදී ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය විසින් ඉටුකරනු ලබන තීරණාත්මක කාර්යභාරය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික) 2018 වසරේ සිට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ ප්‍රධාන ලේකම් ධූරය ද හෙබවීය. මෙම අවස්ථාව සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපති විසින් නව සභාපති වෙත විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරමින් ඔහුගේ නව තනතුර වෙනුවෙන් සුබපැතීය.

# ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක, යුද්ධ හමුදාධිපති හමුවෙයි



ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නව සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී පසුගිය ජූලි මස 12 වන දින යුද්ධ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම සුහද හමුවේදී, යුද්ධ හමුදාධිපති නව සේනාවිධායක වෙත සිය සුබපැතුම් පිරිනමමින් එම විද්‍යාලයේ පුහුණු ක්‍රමවේද පිළිබඳව ද සාකච්ඡා කළේය.

# අභිමන් ගමනකට උණුසුම් සුබපැතුම්




මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඉකුත් ජූලි මස 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. මේජර් ජෙනරාල් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී, මේජර් ජෙනරාල් ආර්පීජ්ආර්පී රාජපක්ෂ ආර්එස්පී, මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් වීඩීඑස් පෙරේරා, මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, මේජර් ජෙනරාල් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී, මේජර් ජෙනරාල් එස්ජ්එන් ආරියසේන සහ මේජර් ජෙනරාල් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී එලෙස යුද්ධ හමුදාධිපති හමුවූ නිලධාරීහු වූහ. උසස්වීම් ලද එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත යුද්ධ හමුදාධිපති විසින් මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත පිරිනමමින් ඔවුන් වෙත සිය සුබපැතුම් එක්කළේය.




මේජර් ජෙනරල් නිලයට උසස්වීම් ලද තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් 2024 ජූලි මස 16 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ. මෙම හමුව සඳහා මේජර් ජෙනරාල් ඩබ්ලිව්එස්එන් හේමරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී, මේජර් ජෙනරාල් ඊඑම්ජීජ් අඹන්පොල සහ මේජර් ජෙනරාල් බීජීඑස් ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක්වූහ. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් උසස්වීම් ලද එම නිලධාරීන් වෙත මේජර් ජෙනරල් නිලයට හිමි අසිපත පිරිනමමින් සුබපැතුම් එක්කළේය.

# 28 වසක අභිමානය සමරා



යාපනය ආරක්‍ෂක සේනා මූලස්ථානය ස්ථාපිත කර 2024 ජූනි මස 19 වන දිනට වසර 28 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් එහි ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවත්සර වැඩසටහනක් පැවැත්විණ. එහිදී, ආඥාපති වෙනුවෙන් පිරිනැමූ සම්මාන මුරය හා සම්මාන පෙළපාලිය, රණවිරු ස්මාරකය අභියසදී මියගිය රණවිරුවන්ට පුෂ්පෝහාර දැක්වීම, ආගමික වතාවත් සිදුකිරීම, සියලු නිල දිවාභෝජන සංග්‍රහය හා සංගීත ප්‍රසංගය සංවත්සර වැඩසටහන් අතර කැපීපෙනුණි. එම අවස්ථාවන් සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානයෙහි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයෝ විශාල පිරිසක් සාමූහිකව එක්රොක් වූහ.







## නිලධාරී නිවස්නය විවෘත කරමින්







යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නිලධාරී නිවස්නය ඉකුත් ජූලි මස 07 වන දින එම රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී විවෘත කෙරිණි. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය.

එම රෙජිමේන්තුවේ දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති මෙම නිලධාරී නිවස්නය සියලු පහසුකම්වලින් සමන්විත කාමර 06 කින් යුක්ත වේ. මෙම විවෘත කිරීමේ උත්සව අවස්ථාවට එම රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.



# ඒකක සංචාරයක



ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජුලි මස 10 වන දින 16 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය. එහිදී, එම ඒකකයේ පාලන හා සුබසාධන කටයුතු පිළිබඳ සොයා බැලූ හෙතෙම හටපිරිස් අමතන්නට ද අමතක නොකළේය.



# කුරුඳු වගා ව්‍යාපෘතියක්



රටේ ආර්ථිකය සවිබල ගැන්වීම උදෙසා කෘෂිකර්මාන්තය නගා සිටුවීමට යුද්ධ හමුදාව දායක කරවීමේ අරමුණින් කුරුඳු වගා ව්‍යාපෘතියක් ආරම්භ කෙරිණ. ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මගපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශයේ පිහිටි නන්දිමිත්‍ර ගම සැළලිහිණිගම, නාමල් ගම, බෝගස් වැව යන ගම්මාන කේන්ද්‍රකර ගනිමින් මෙම වැඩසටහන පැවැත්විණ.

ඒ අනුව වන්නි ප්‍රදේශයේ සාර්ථකව වගා කළ හැකි දැනට වගා කර සාර්ථක ප්‍රතිඵල ලබන කුරුඳු වගාව තවදුරටත් ප්‍රචලිත කිරීම මගින් ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුල්වල ආර්ථිකය සවිමත් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරේ. මෙහිදී, කුරුඳු වගාව සඳහා ඉඩම් ලබාදීම, කුරුඳු පැළ ලබාදීම, කුරුඳු තැලීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ගොවියන් පුරුදු කරවීමට යුද්ධ හමුදාව ඉදුරාම දායකත්වය සපයනු ලබයි. මෙම ව්‍යාපෘතියේ ආරම්භය සනිටුහන් කරමින් සැළලිහිණිගම හා නාමල්ගම ගම්මානවල ඉඩම්ලාභී ගොවීන් වෙත කුරුඳු පැළ 8000 ක් බෙදාදීම ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් 2024 ජුනි මස 11 වන දින සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා 21 සහ 56 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික, 211 සහ 563 වන පාබල බලසේනාධිපතිවරු, 11 ගැමුණු හේවා බළඇණිය සහ 9 ගජබා රෙජිමේන්තු අණදෙන නිලධාරීවරු ඇතුළු ගම්වාසීහු ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ සංචාරයක



හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානය (නැගෙනහිර) සහ ඒ යටතේ ස්ථාපිත ඒකකයන්හි පරිපාලන කටයුතු සහ හටපිරිස්වල සුවදුක් විමසීමේ අරමුණින් පසුගිය ජූලි මස 03 වන දින ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ඒ කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී එහි සංචාරයක නිරත විය.

එහිදී, හටකාර්ය සම්පාදක අණසක ආඥාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්එන් විජේකෝන් එන්ඩීසී ඒඒටීඕ විසින් ආරක්ෂක සේනා ආඥාපති උණුසුම් අයුරින් පිළිගන්නා ලදී. යුද්ධ හමුදා රාජකාරි ඉටුකරමින් හටපිරිස් අතර සුහදත්වය පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කරමින් එහි හටපිරිස් ඇමතූ ආරක්ෂක සේනා ආඥාපති එම ඒකකයන්හි නිලධාරීන් සහ සෙසුනිලයන් සමඟ සුහද පිළිසඳරක ද නිරතවූහ.





# සුහද හමුවක මතක සටහන්



මේජර් ජෙනරාල් සහ බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන මේජර් ජෙනරාල් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී, මේජර් ජෙනරාල් කේජ්‍යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී සහ බ්‍රිගේඩියර් ආර්ආර් ද එස් ධර්මවික්‍රම ආර්එස්පී ඉකුත් ජූලි මස 11 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ.

නව උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඉතා උණුසුම් ලෙස පිළිගත් ආරක්ෂක සේනා ආඥාපති ඔවුන්ගේ සුවිශේෂී වෘත්තීය ජයග්‍රහණ පිළිබඳව සිය හෘදයාංගම සුබ පැතුම් පිරිනැමීය. යුද්ධ හමුදාව වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම, නායකත්වය සහ සේවය අගය කළ ඔහු, රටේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගේ කාර්යභාරයේ වැදගත්කම ද අවධාරණය කළේය.







# 9 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවෙන් නව නිවසක්

වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 286 සිංහපුර ග්‍රාම නිලධාරී වසමේ වෙසෙන අවශ්‍යතා සහිත යුද්ධ හමුදා සාමාජිකයකු වෙනුවෙන් ඉදිකරන ලද නව නිවසක් පසුගිය ජූලි මස 11 වන දින ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බලකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ සුරතින් නිවැසියන් වෙත භාරකෙරිණ.

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් මත ඉදිකළ මෙම නිවස සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය කාංචන මාරසිංහ යන අය දරණු ලැබීය. 9 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්අයිඑස් චන්ද්‍රකුමාර යූඑස්පී පීඑස්සී අයිජී ගේ අධීක්ෂණය මත එම ඒකක හටපිරිස සිය තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වයෙන් නව නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකළහ. එහිදී, නිවාසලාභී පවුලේ සාමාජිකයන් වෙත ගෘහ උපකරණ සහ වියළි ආහාර සලාක පාර්සලයක් ද පරිත්‍යාග කෙරුණු අතර, එම අවස්ථාවට නිලධාරීන්, සෙසුනිලයන් සහ නිවාසලාභීන්ගේ ඥාතීහු ද එක්ව සිටියහ.

# ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති සිය බලප්‍රදේශයේ සංචාරයක



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ඉකුත් ජූලි මස 05 වන දින දියතලාව ප්‍රදේශයේ පිහිටි 17 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය, 2 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සහ 8 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා ඒකකයන්හි සංචාරයක නිරතවිය.

එහිදී, එම ඒකක අණදෙන නිලධාරීන් විසින් ආඥාපතිව උණුසුම් අයුරින් පිළිගනිමින් එම ඒකකයන්හි කාර්යභාරය සහ පරිපාලන කටයුතු සබැඳිව එතුමන් දැනුවත් කළහ. ආඥාපති එහිදී එම හටපිරිස්වල සුබසාධන අවශ්‍යතා පිළිබඳව සොයාබලමින් ඔවුන් හා සුහද කතාබහක යෙදෙන්නට ද අමතක නොකළේය.





# කඩවත්මඩුව පින්බිමට රණවිරු සත්කාරයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාව මැදිහත්ව ඉකුත් ජූලි මස 21 වන දින කඩවත්මඩුව ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේ දී පරිත්‍යාග වැඩසටහනක් සිදුකරනු ලැබීය. එහි විහාරාධිපති වජිරාලංකාර ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වය යටතේ පවත්වාගෙන යන දහම් පාසලේ ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දරු දැරියන් අසූතුන් දෙනකු වෙත ජාතික ඇඳුම් සඳහා රෙදි සහ පොත්පත් ප්‍රදානය කෙරුණි. එසේම, එහි ධර්ම ශාලාවේ බිත්තිවල වර්ණ ගැන්වීම සඳහා අවශ්‍ය තීන්ත ඇතුළු විහාරස්ථානයේ පරිහරණයට අවශ්‍ය ද්‍රව්‍ය රැසක් ද පරිත්‍යාග කරන ලදී. මෙහිදී, මහා සංඝරත්නය උදෙසා දානය පූජා කිරීම සහ සියලුම දරුදැරියන් වෙත කිරි බෝතල් සමඟ දිවා ආහාරය ලබාදීමට ද කටයුතු කෙරිණ.



මෙම මාහැගි සත්කාරය සඳහා ලලිත් අමරනාත් සහ එන්. ඉලේපෙරුම යන මහත්ම මහත්මීහු අනුග්‍රහක දායකත්වය දැක්වූහ. ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සහ යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී සමගින් එම බලකා සේවාවනිතා ශාඛාවේ සභාපතිනි වරුණි කුලතුංග මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු මෙම මෙම පුණ්‍ය කටයුත්තට එම සේවාවනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.





# නව නිවසට මුල්ගල්





4 ගැමුණු හේවා බලකා බලප්‍රදේශයට අයත් එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි සිත්තන්ඩි 03 ග්‍රාම නිලධාරි වසමේ පදිංචි ස්ථිර නිවසක් නොමැති කිටිනපිල්ලේ තෙයිවානෙයි නම් විවාහක තිදරු මව වෙත අංගසම්පූර්ණ නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීමේ උත්සවයක් ඉකුත් ජූලි 12 වන දින සිදුකෙරිණ. 232 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්පීඑස් ප්‍රසාද් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමාජ සත්කාරය සඳහා මාතලේ කයිකාවල පිහිටි ඕමාන් ලංකා මිනරල් එක්ස්ප්ලෝරේෂන් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ වාතනි මෝහනශාකර් මැතිණිය මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබුවාය. අදාළ නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය 4 ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී මේජර් එස්පීඅයිඑච් සේනානායක පීඑස්සී එල්එස්සී ගේ අධීක්ෂණය මත එම බළඇණි හටපිරිස් විසින් ලබාදුන්හ.

# ඒකක සංචාරයක මතක සටහන්

යුද සේවා ලේකම් සහ ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් අයිඑන්බී පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් ජූලි මස 02, 04, 22 සහ 25 යන තෙදින තුළ දින 08(සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 14(සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 1 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සහ ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපළ - හබරකඩහි නිල සංචාරයක නිරත විය. එහිදී, අණදෙන නිලධාරීන් එම ඒකක තුළ සහ වැඩපළෙහි වත්මන් මෙහෙයුම් මෙන්ම පරිපාලන කටයුතු පිළිබඳ බලකාධිපති දැනුවත් කළහ. සිය සංචාරයේදී භටපිරිස්හි සුභසාධන පහසුකම් සහ අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ බලකාධිපති ඔවුන් අමතන්නට ද කටයුතු කළේය. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේඑල් මුණසිංහ යූඑස්පී ඇතුළු පිරිසක් ද එක්වූහ.



8(සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව



14(සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව



ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපළ (හබරකඩ)

# “සියවස” කාර්යාල සංකීර්ණයේ ඉහළ මහල විවෘත කෙරේ





යුද්ධ හමුදා සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ස්ථාපිත "සියවස" කාර්යාල සංකීර්ණයේ ඉහළ මහල ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හා යුද්ධ හමුදා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ගේ සුරතින් ඉකුත් ජූනි මස 27 වන දින විවෘත කෙරිණි. නව කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුවේ ඉදිකිරීම් කටයුතු සඳහා යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ මඟපෙන්වීම මත එම සේවා වනිතා ශාඛාව වෙතින් අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය. මෙම උත්සවයට සමගාමීව පිරිත් සජ්ඣායනාවක් සහ මහා සංඝරත්නය උදෙසා හීල් දානය පූජාකිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා බලකා නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.



# කෘෂි හා පශු සම්පත් බලකායේ සංචාරයක නිරත වෙමින්





හටකාර්ය සම්පාදක අණසක මූලස්ථාන ආඥාපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඒටීඕ විසින් ඉකුත් ජූලි මස 10 වන දින කරන්දෙණියේ පිහිටි යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායේ සංචාරයක නිරතවිය. එහිදී, හටපිරිස් සමග සුහද කතාබහකද නිරත වූ ආඥාපති ඔවුනගේ හටකාර්ය අවශ්‍යතා පිළිබඳ සොයාබැලීය. එම බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේජ්එස්කේ සිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් ආඥාපති වෙත එම සංචාරය සිහිවීම සඳහා සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# විරු දිරියෙන් අක්ෂි සායනයක්

56 වන පාබල සේනාංකය වෙතින් පවත්වනු ලැබූ අක්ෂි සායන මාලාවේ තවත් පියවරක් ලෙස 7 ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තු හටපිරිස් විසින් සංවිධානය කළ අක්ෂි සායනයක් ඉකුත් ජූනි 02 වන දින පුලියන්කුලම් ප්‍රදේශයේ පන්ඩ්‍රිකේතුකුලම් පාසල් පරිශ්‍රයේ දී පැවැත්විණ. ඒ සඳහා දෘෂ්‍යාබාධිත අයවලුන් 366 දෙනෙක් සහභාගී වූ අතර, එහිදී ඇස් කණ්නාඩි 138 ක් පිරිනැමීම සහ දෘෂ්‍යාබාධිත අයවලුන් 45 දෙනෙක් ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සඳහා යොමුකරවීම ද සිදුකරනු ලැබූහ.

තවද, වව්නියාව ප්‍රදේශයේ ඇස් පෙනීමේ දුර්වලතා ඇති පුද්ගලයින්ට උපකාර කිරීමේ අරමුණින් 12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් ද සංවිධානය කළ තවත් අක්ෂි වෛද්‍ය කඳවුරක් ඉකුත් ජූනි 09 වන දින කාකියන්කුලම මුස්ලිම් මහ විද්‍යාලයේදී පැවැත්විණ. එහි පළමු අදියර ලෙස දෘශ්‍යාබාධිත අයවලුන් 290 ක් සඳහා අක්ෂි සායනය සහ ඇස්කණ්නාඩි ප්‍රදානයද, දෙවන අධියර ලෙස ඔවුන් අතරින් 52 දෙනෙකුගේ ඇසේ සුද ඉවත් කිරීමේ සැත්කම් ද සිදුකෙරිණ.

ත්‍යාගශීලී දායකත්වයෙන් සිදුකළ මෙම සත්කාරය පුනරුත්ථාපනය සඳහා සහයදීමේ සහ නැවත පදිංචි කිරීමේ සංවිධානයේ ලේකම්, ආචාර්ය වේලායුධම් සර්වේශ්වරන් මැතිතුමාගේ දායකත්වයෙන් සහ 56 වන පාබල සේනාංක සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩිසී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ සිදුවිය.





*7 ශ්‍රීලංකා සිංහ රෙජිමේන්තු හටපිරිස් විසින් සංවිධානය කළ අක්ෂි සායනය*





*12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සංවිධානය කළ අක්ෂි සායනය*

# 65 වසක අභිමානය සමරන 1 පුරෝගාමී බලකාය





1 යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ 65 වන සංවත්සරය ඉකුත් ජූලි 05 වන දින එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර්පීසීඑන් පියතිස්ස අයිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සැමරිණ. අණදෙන නිලධාරී වෙත සම්මාන පෙළපාලියකින් ආචාර පුදකිරීම, සියළු නිල දිවා භෝජනය, හටපිරිස් ඇමතීම ඇතුළු වැඩසටහන් රැසකින් සංවත්සර සැමරුම් උත්සවය වර්ණවත් විය.

# අභ්‍යන්තර ආරක්‍ෂක මෙහෙයුම් පිළිබඳ වැඩමුළුවක්





ආරක්‍ෂක සේනා මූලස්ථානයන්හි රාජකාරී නියුතු නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් වූ අභ්‍යන්තර ආරක්‍ෂක මෙහෙයුම් (*MISO*) පිළිබඳ වැඩමුළුවක් ඉකුත් ජූලි මස 02 සහ 03 යන දෙදින තුළ ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) දී පැවැත්විණ. එහි ආඥාපති ගේ මගපෙන්වීම යටතේ නීති සේවා, මානව හිමිකම් සහ මානුෂීය නීති අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ මෙම වැඩමුළුව ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (*ICRC*) නියෝජිත පිරිසක් විසින් මෙහෙයවනු ලැබූහ. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත හා අග්නිදිග ආසියාව, ඉන්දුනීසියාව සහ නැගෙනහිර ටිමෝරය සන්නද්ධ හමුදාවන්හි නියෝජිත බ්‍රිගේඩියර් ජෙනරාල් (විශ්‍රාමික) ලොයිඩ් ගිලට් (*Brigadier General (Retired) Lloyd Gillett*) සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිත හා සන්නද්ධ හා ආරක්‍ෂක වැඩසටහන් උපදේශක එල්සී චන්න ජයවර්ධන යන මහත්වරු එම වැඩසටහන මෙහෙයවූ පිරිසට අයත්වූ අතර, ඊට නිලධාරීන් 45 දෙනෙක් සහභාගී වූහ.

# 1 පොලිස් සේවා බලකායෙන් හරවත් දේශනයක්





සංවිධානාත්මක අපරාධ, මූල්‍ය වංචා, මත්ද්‍රව්‍ය භාවිතය/ජාවාරම්, ළමා අපචාර, ස්ත්‍රී දූෂණ සහ මාර්ගගත සූදුව වැනි කරුණු සබැඳිව හටපිරිස් දැනුවත් කිරීම වෙනුවෙන් වූ දේශනයක් ඉකුත් ජූලි මස 10 වන දින 4 කාලතුවක්කු හමුදා දේශන ශාලාවේදී පැවැත්විණ. 1 යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ අණදෙන නිලධාරී මේජර් වීඑන්එම් ජයසේකර යූඑස්පී එල්එස්සී විසින් මෙහෙයවූ මෙම දේශනයට පනාගොඩ යුද්ධ හමුදා ජනපදය යටතේ සේවයේ නියුතු නිලධාරීන් 20 දෙනෙක් සහ සෙසුනිලයෝ 160 දෙනකු සහභාගී වූහ.

# රණවිරු සරණක්





11 විජයබාහු පාබල රෙජිමේන්තුවේ මඟපෙන්වීම යටතේ තොන්ඩමන්නාරු සෙල්වසන්න කෝවිල අසල ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආහාර පාර්සල් බෙදාදීමේ සත්කාරයක් ඉකුත් ජූලි 08 වන දින සිදුකෙරිණ. මෙම මාහැඟි කටයුත්ත එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ඉමහත් ඇගයීමට ලක්විය.

# දූ දරුවන්ගේ ක්‍රීඩා දිවියට අත්වැලක් වෙමින්





51 වන පාබල සේනාංකය සහ උරුම්පිරායි ජූනියර් පාපන්දු ඇකඩමිය එක්ව කෝපායිහි එම සේනාංක මූලස්ථානයේ පිහිටි *'CIMIC'* උද්‍යාන පාපන්දු ක්‍රීඩාංගණයේදී ඉකුත් ජූලි මස 06 සහ 07 යන දිනයන්හිදී පාපන්දු තරඟාවලියක් පැවැත්විණ. ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ උපදෙස් සහ මඟපෙන්වීම මත සංවිධානය කෙරුණු මෙම තරඟාවලියට උතුරු පළාතේ කනිෂ්ඨ පාපන්දු කණ්ඩායම් 32 ක් සහභාගී වූහ. ඉදිරියේදී පැවැත්වීමට නියමිත දෙවන වටයේ තරඟ සඳහා කණ්ඩායම් අටක් මෙහිදී තෝරා ගැනිණි. 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම තරඟාවලියට ප්‍රදේශවාසීන් ගුරුවරු සහ සිසුහු රැසක් ද සහභාගී වූහ.

# අභිමානවත් 17 වන සංවත්සරය සමරමින්




141 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ආර්ආර් ද එස් ධර්මවික්‍රම ආර්එස්පී ගේ මඟපෙන්වීම යටතේ එම බලසේනාවේ 17 වන සංවත්සරය පසුගියදා අභිමානවත් අයුරින් සමරනු ලැබීය. එහිදී, බලසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පැවැත්වීම, රුක් රෝපණය, සියලු භටපිරිස් ඇමතීම, සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය, දානමය පිංකමක් පැවැත්වීම සහ ප්‍රතිසංස්කරණය කරන ලද මුර කුටියක් විවෘත කිරීම සංවත්සරය නිමිත්තෙන් පැවති වැඩසටහන් අතර ප්‍රධාන විය.





# මුලතිව් සටනේ දී දිවිදුන් විශේෂ බලකා විරුවන් සැමරේ





1996 වසරේ සිදුවූ මුලතිව් සටනේ දී මව්බිම වෙනුවෙන් දිවිපිදූ කර්නල් ඒඑෆ් ලෆිර් පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් දෙදෙනෙක් සහ සෙසුනිලයන් 36 දෙනෙක් සිහිකර උපහාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් ජූලි මස 19 වන දින විශේෂ බලකා රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණි. විශේෂ බලකා බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මඟපෙන්වීම යටතේ පැවති මෙම අභිමානවත් උත්සවයට එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, 1 විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ටීපීජීකේපී අල්විස් ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ. තවද, එම සැමරුමට සමගාමීව මාතලේ මඩවල උල්පත ප්‍රදේශයේ පිහිටි වර්ණකුලසූරිය වැඩිහිටි නිවාසයේ නේවාසික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආහාරපාන සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහනක් ද විශේෂ බලකා භටපිරිස් විසින් සංවිධානය කරන ලදී.

## සිවිල් සේවක මහතුන් වෙනුවෙන් සුහද හමුවක්





22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ අදහසකට අනුව එම සේනාංක මූලස්ථානයේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් වූ සංචාරයක් ඉකුත් ජූලි මස 13 වන දින සිදුකෙරිණ. සිවිල් සේවක මහතුන් 21 දෙනකු සහ එම පවුල්වල සාමාජිකයින් 16 දෙනකු සහභාගී වූ මෙම සංචාරයේදී ඔවුනට ත්‍රිකුණාමලය ප්‍රදේශයේ තුළ පිහිටා ඇති වැදගත් ස්ථාන නැරඹීමට ඉඩ ප්‍රස්ථාව සැලසුනහ. තවද, ඔවුන් හට අවශ්‍ය පරිදි ආහාර පාන සහ නවාතැන් පහසුකම් ලබාදීමට ද එදින රාත්‍රියේ ඔවුන් වෙනුවෙන් සංගීත සැඳෑවක් පැවැත්වීමට ද කටයුතු කෙරිණ.

# වාර්ෂික පොංගල් උත්සවයට සහභාගී වෙමින්



වව්නියා දමිළ වැසියන් විසින් වාර්ෂිකව පවත්වනු ලබන පොංගල් උත්සවය ඕමන්ත අරසපර්ති ශ්‍රී කන්නකායි අම්මාන් රන් කෝවිලේදී ඉකුත් ජූලි 13, 14 සහ 15 යන තෙදින තුළ පැවැත්විණ. මෙම උත්සවය සාර්ථක කරගැනීම සඳහා 56 වන පාබල සේනාංක භටපිරිස් විසින් සහය ලබාදුන් අතර, එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී එම උත්සවයට ආරාධිත අමුත්තා ලෙසද සහභාගී විය.

# රුක් රෝපණ වැඩසටහන් රැසක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 40 වන සංවත්සරය නිමිත්තෙන් 1 බලකායේ භටපිරිස් විසින් ඉකුත් ජූලි මස 12 වන දින එම බලකා පරිශ්‍රයේදී රුක් රෝපණ වැඩසටහනක් සංවිධානය කරන ලදී. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ අදහසකට අනුව 1 බලකායේ බලකාධිපති ගේ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන සිදුකළ අතර, එහිදී මී, සියඹලා, මහෝගනී, දඹ සහ කොහොඹ පැළ 300 ක් රෝපණය කරන ලදී.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 40 වන සංවත්සරය නිමිත්තෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි රුක් රෝපණ වැඩසටහන් පවත්වනු ලැබූ අතර, එහිදී ඉකුත් ජූලි මස 12 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) වෙතින් ද රුක් රෝපණ වැඩසටහනක් පවත්වන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් ඒඑච්ඒඩී ආරියසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පිඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ. මෙහිදී මී, කජු, දෙලුන්, කොස් සහ තවත් ශාක වර්ග රැසක් රෝපණය කරන ලදී.



# සේරුවාවිල මංගල රජමහා විහාරයේ සෙල්ලිපි ග්‍රන්ථාරූඪ කිරීම





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපතිගේ උපදෙස් පරිදි සේරුවාවිල මංගල රජමහා විහාරයේ පිහිටා ඇති ඉපැරණි සෙල්ලිපි ග්‍රන්ථාරූඪ කර ඒවායේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූනි මස 26 වන දින සිට ජූලි මස 11 වන දින දක්වා පැවැත්විණ. 22 වන පාබල සේනාංකයේ භටපිරිසකගේ ශ්‍රම දායකත්වයෙන් පැවති මෙම කටයුත්ත සඳහා සේරුවිල මංගල රජමහා විහාරය, කැලණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, සේරුවාවිල ප්‍රාදේශීය සභාව සහ සේරුවාවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සහයෝගය ලබාදෙන ලදී. මෙයට අමතරව සේරුවාවිල මංගල රජමහා විහාරයේ තිකිනි පෙරහැරට වසර 100 ක් සපිරීම හා මෙම සෙල්ලිපි ග්‍රන්ථාරූඪ කිරීමේ වැඩසටහන අරමුණු කර ගනිමින් සංස්කෘතික තොරතුරු රාශියකින් සමන්විත ග්‍රන්ථයක් ද එළිදැක්වීමට නියමිතව ඇත.





# විරු දිවියට අත හිත







ගැමුණු හේවා බලකායට අයත් සේවයේ යෙදී සිටින හා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලබාසිටින රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට මෙන්ම සිවිල් සේවක මහතුන් සඳහා සත්කාරක සේවාවන් රැසක් සිදුකිරීමට ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව මැදිහත් විය. මේ යටතේ වෛද්‍යාධාර වශයෙන් ඇස් කණ්නාඩි සහ කෘත්‍රිම පාද ලබාදීම, 2023 වර්ෂයේ උසස්පෙළ විභාගය සඳහා පෙනීසිට විශිෂ්ඨ සමාර්ථ ලබාගත් දූ දරුවන් ඇගයීම වස් ඔවුනට ශිෂ්‍යාධාර මුදල් සහ පාසල් උපකරණ පිරිනැමීම සිදුවිය.

මෙම සත්කාරක සේවා සිදුකළ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය. එහිදී එම රෙජිමේන්තු සාමාජිකයින්ගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා නවතමයෙන් ඉදිකරන ලද ජල පිරිපහදු යන්ත්‍රයක් විවෘත කිරීමද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් සිදුවූවාය.




# මාසික මහසභා රැස්වීම සාර්ථකව අවසන්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ වාර්ෂික මහසභා රැස්වීම එම ඒකක සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 19 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. සියලු රෙජිමේන්තුවලට අයත් සේවා වනිතා සභාපතිනියන් සහ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම රැස්වීමේදී රණවිරු සුබසාධනය උදෙසා පැවැත්විය යුතු නව සුබසාධන ව්‍යාපෘති කාර්යක්ෂමව පවත්වාගෙනයාම පිළිබඳ සාකච්ඡා කරන ලදී. තවද, එහිදී රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුබ සාධනය උදෙසා පරිත්‍යාග කිහිපයක් පිරිනැමුනු අතර, ඒ යටතේ නිවාස ආධාර, වෛද්‍යාධාර, දරු උපත් මූල්‍යාධාර, පාසල් උපකරණ සහ වියළි සලාක පරිත්‍යාග කෙරිණ.

# සන්නද්ධ බුද්ධි බලකායෙන් වැඩසටහන් රැසක්



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහනක් පසුගිය ජූලි මස 18 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එමෙන්ම, යුද්ධ හමුදා සාමාජිකයින්ගේ බිරින්දෑවරුන් වෙනුවෙන් සංවිධානය කෙරුණු දැනුවත් කිරීමේ දේශනයක් ද ඊට ඇතුළත් විය.





තවද, සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රසාදිනී රණසිංහ මහත්මියගේ උපදෙස් මත පවත්වනු ලැබූ චිත්‍ර තරඟයේ ජයග්‍රාහී දරුවන් හට ත්‍යාග පිරිනැමීම ද එම බලකායේ සේවයේ නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ද එදින පැවැත්විණ.





# රණක්ෂිත රණවිරුවන්ට



# පරිත්‍යාග රැසක්

මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කායදානය ලබාදී රණක්ෂිතයට පත්ව අභිමංසල I, II, III හා අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන් හා උපස්ථායක අයවලුන් 100 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීම යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මිය විසින් පසුගිය ජූලි මස 28 වන දින සිදුකරනු ලැබුවාය.



එහිදී, අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙත තෑග්ගක්/තෑපැන් සංග්‍රහයක් පිරිනැමීමත්, ඔවුන්ගේ මානසික සුවතාවය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා කැලිප්සෝ කණ්ඩායම විසින් සංගීත ප්‍රසංගයක් පැවැත්වීමත් සිදුකෙරිණ.



තවද, පාන්ගොල්ල අභිමංසල III සුවසහන නිකේතනයෙහි ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් ඉදිකර ඇති පිහිනුම් තටාකය සඳහා අවශ්‍ය පවිත්‍රතා ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා ඇතුළත් භාණ්ඩ කට්ටලයක් ලබාදීම ද සිදුකෙරිණ.




මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ටීඑච්ඩීඑස් තිරිමාන්න යූඑස්පී, අත්තඩිය මිහිඳු සෙත් මැඳුරෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීඑස් ද එස් රාජකරුණා ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.



# යුද්ධ හමුදාධිපති පූර්ණ නිවාස ව්‍යාපෘතිය යටතේ තවත්
# නව නිවසක්

යුද්ධ හමුදාධිපති ගේ අදහසක් මත ක්‍රියාත්මක "යුද්ධ හමුදාධිපති පූර්ණ නිවාස ව්‍යාපෘතිය" යටතේ ඉදිකළ නව නිවසක් 12 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් මියගිය සෙ/12කිපු01644 ලා/කෝ කුමාරසිංහ ජීඩී ගේ ලඟම ඥාතියා වෙත භාරදීම ඉකුත් ජුනි මස 30 වන දින සිදුකෙරිණ.

බිබිල කෝන්ගොල්ල ප්‍රදේශයේ ඉදිකළ මෙම නව නිවස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවේ සභාපති ජානකී ලියනගේ මහත්මිය විසින් එම රණවිරුවාගේ ලඟම ඥාතියා වන ඩබ්ලිව්.එම්. දීපිකා ජයවර්ධන මහත්මිය වෙත භාරදෙනු ලැබුවාය. එම නිවසට අවශ්‍ය ගෘහ විදුලි උපකරණ ද මෙම අවස්ථාවේදී ප්‍රදානය කෙරුණු අතර, එහි ඉදිකිරීම සඳහා එම රෙජිමේන්තු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය හිමිවූහ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් සහ එහි මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක් මෙම නිවස ප්‍රදානය කිරීමේ අවස්ථාවට එක්වූහ.







## සේවා වනිතාවෙන් සත්කාරයක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිතුමියගේ උපදෙස් හා අධීක්ෂණයෙන් ආසේමු (වන්නි) හා ආසේමු (බටහිර) බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 200 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජූලි මස 07 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිතුමියගේ කාර්යාලයේ දී පැවැත්විණ.

යුද්ධ හමුදා සාමාජිකයින්, සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සැමට කිසියම් ආර්ථික සහනයක් සලසාදීමේ මෙහි අරමුණයි.





# විරු කැකුළු දරුවන්ගේ කුසලතා ඇගයේ

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මඟින් රණවිරු සුභසාධනය අරමුණු කොටගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් පෙරපාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. එමඟින් යුද්ධ හමුදා නොවන අයවලුන්ගේ දරුවන් හටද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසාදී ඇත. ඒ අතුරින් පල්ලේකැලේ, පනාගොඩ, දියතලාව සහ ගාල්ල විරු කැකුළු පෙර පාසල්හි ඉගෙනුම ලබන දරු දැරියන්ගේ එළිමහන් ක්‍රියාකාරකම් ඔප්නැංවීමේ අරමුණින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකි ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු වාර්ෂික ක්‍රීඩා උත්සවයන්හි මතක සටහන් මෙහි දැක්වේ.





ඉකුත් ජූලි 24 වන දින පනාගොඩ විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවය



ඉකුත් ජූලි 16 වන දින දියතලාව විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවය



ගාල්ල විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූලි 22 වන දින පැවති ක්‍රීඩා උත්සවය



ඉකුත් ජූලි 26 වන දින පල්ලෙකැලේ විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී පැවති ක්‍රීඩා උත්සවය



ඉකුත් ජූලි 29 වන දින ඉපලෝගම විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේ පැවති ක්‍රීඩා උත්සවය



අනුරාධපුර විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූලි 26 වන දින පැවති ක්‍රීඩා උත්සවය



මැතිංටවුන් විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූලි 23 වන දින පැවති ක්‍රීඩා උත්සවය




මින්නේරිය විරු කැකුළු පෙර පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූලි 30 වන දින පැවති ක්‍රීඩා උත්සවය



# දියතලාවේදී දරු දැරියන්ට තිළිණ රැසක්










යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා අධීක්ෂණයෙන් එම ඒකක පූර්ණ දායකත්වයෙන් දියතලාව ඇල්ලේගම මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරනු ලබන දරු දැරියන් 177 දෙනකු හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 01 වන දින එම පාසලේදී පැවැත්විණ. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය. තවද, එම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මෙන්ම කාලතුවක්කු හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සියලුම ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරිනී මෙන්ම කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ස්වේන්ද්‍රිනී රොද්‍රිගෝ මහත්මිය, ඇල්ලේගම මහා විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය, දූ දරුවන් සහ දෙමව්පියෝ ද සහභාගී වූහ.

එම වැඩසටහන නිමාවෙන් පසු සේවා වනිතා සභාපතිනිය එම ඒකකය වෙතින් පාලනය වන දියතලාවේ පිහිටි විරු කැකුළු පෙරපාසල, දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ *Shop of the Garrison* ද නිරීක්ෂණය කළාය. එහිදී, එම දරුවන් සමඟ සුහද පිළිසඳරක ද නිරත වූ එතුමිය එහි පරිපාලන නිලධාරීන් සමඟ ඉදිරි අභිවෘද්ධිය පිළිබඳ සාකච්ඡාවක් ද සිදුකළාය.

# වියලි සළාක පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ උපදෙස් සහ අධීක්ෂණයෙන් යුතුව ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සහ (නැගෙනහිර) බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් 200 දෙනකු සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියලි සළාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි මස 18 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක කාර්යාලයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා වශයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සහභාගී වූ අතර, යුද්ධ හමුදා සාමාජිකයින් හට ආර්ථික සහනයක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කෙරිණ.

# පොහොය දිනට සමගාමීව දානමය පිංකමක්





පොසොන් පොහොය දිනය නිමිත්තෙන් සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සමන්කා ප්‍රනාන්දු මහත්මියගේ මඟපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාව විසින් ඉකුත් ජූලි මස 04 වන දින නුගේගොඩ ශ්‍රී ප්‍රඥෝදය මහා පිරිවෙනේදී භික්ෂූන් වහන්සේලා සිය නමක් වෙනුවෙන් දානමය පිංකමක් පවත්වන ලදී. මෙම අවස්ථාවට එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් එක්වූහ.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාග වැඩසටහනක්





පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අධීක්ෂණය යටතේ එම රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී පරිත්‍යාග වැඩසටහනක් ඉකුත් ජූලි මස 06 වන දින පැවැත්විණි. මෙම වැඩසටහනේදී රණවිරුවන් 11 දෙනකු වෙත ඔවුන්ගේ ඉදිකරමින් පවතින නිවාස සම්පූර්ණ කිරීම සඳහා රුපියල් 200,000.00 බැගින් මූල්‍යමය ආධාර ප්‍රධානය කරනු ලැබීය. කොළඹ, ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ 95 කණ්ඩායම මෙම ව්‍යාපෘතියට අනුග්‍රාහකත්වය දැක්වූ අතර, එහිදී මෙම වැඩසටහනට සමගාමීව, රණවිරුවන් දෙදෙනෙකුගේ ආබාධිත දරුවන් දෙදෙනෙකු සඳහා රෝද පුටුවක් සහ නාන කාමර උපාංග කට්ටලයක් ද පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වජිරා පෙරේරා මහත්මිය, එම රෙජිමේන්තු නිලධාරීන්, සෙසු නිලයින් සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ 95 කණ්ඩායමේ සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

## "අභිමංසල - 2" සුවතා නිකේතනයේ සංචාරයක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ මඟපෙන්වීම යටතේ එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් ජූනි මස 29 වන දින කඹුරුපිටිය අභිමංසල 2 සුවතා නිකේතනයේ සංචාරයක නිරත වූහ. මෙම සංචාරයේ අරමුණ වූයේ එම සුවතා නිකේතනයේ පුනරුත්ථාපන වන රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීමයි. එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙත තේ පැන් සංග්‍රහයක් ද එහිදී පිරිනැමීමෙන් අනතුරුව, 3(සෙව්) ගැමුණු හේවා බලකායේ කැලිප්සෝ සංගීත කණ්ඩායම විසින් සංගීත රසාස්වාදයද ලබාදුන්හ. තවද එම සුවතා නිකේතනයේ ප්‍රයෝජනය සඳහා විදුලි බුබුළු සහ අත්‍යාවශ්‍ය සනීපාරක්‍ෂක ද්‍රව්‍යයන්ගෙන් සමන්විත ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.

## ප්‍රජා සත්කාරක වැඩසටහනක්





කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව වෙතින් කඩුවෙල විල්බට් පෙරේරා අනුස්මරණ වැඩිහිටි නිවාසයෙහි නේවාසික වැඩිහිටියන් 26 දෙනකු වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඉකුත් ජූලි 14 වන දින පවත්වන ලදි. එහිදී එම වැඩිහිටි නිවාසය සහ ඔවුන් සුද්ධ පවිත්‍ර කිරීමත්, පිරිත් දේශනාවක් පැවැත්වීමත්, ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා මදුරු දැල් සහ පිරිසිදුකාරක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමක් ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, එහි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් බීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිමාලි රණතුංග මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## ගර්භණී මව්වරුන් වෙනුවෙන් පරිත්‍යාගයක්





විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනෝජා පීරිස් මහත්මියගේ අදහසකට අනුව 4 වන විශේෂ බලකාය වෙතින් ගර්භණී මව්වරුන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 13 වන දින පැවැත්විණ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රශාදිනී රණසිංහ මහත්මියගේ මඟපෙන්වීම මත එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ අම්බලන්ගොඩ පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසයේ නේවාසික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් පරිනමන මාසික දානමය වැඩසටහන ඉකුත් ජුනි මස 29 වන දින පවත්වනු ලැබූහ. එම බලකා සේවා වනිතා සාමාජිකාවක් වන දිල්හානි ප්‍රියලාල් මහත්මිය මෙම දානමය පිංකම සඳහා සිය අනුග්‍රාහකත්වය දැක්වූවාය.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් වෛද්‍යාධාර







ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදිතා පෙරේරා මහත්මියගේ මූලිකත්වයෙන් ඉකුත් ජුනි මස 27 වන දින මූල්‍ය පරිත්‍යාග වැඩසටහනක් පැවැත්විණ. 4(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙතින් සංවිධානය කළ මෙම වැඩසටහනේ දී තෝරාගත් සේවයේ නියුතු සොල්දාදුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් 06 දෙනකු වෙත මූල්‍ය පරිත්‍යාග පිරිනැමිණ.

# පොසොන් බැති ගී ප්‍රසංගයක්






පසුගිය ජුනි මස 21 වන දිනට යෙදුණු පොසොන් පොහොය නිමිත්තෙන් වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව මගින් පොසොන් බැති ගී ප්‍රසංගයක් හා දන්සැලක් පැවැත්විණ. එම බලකා සේවා වනිතා සභාපතිනි වෛද්‍ය නිල්මිණි ප්‍රනාන්දු මහත්මිය හා යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීජ්සී ප්‍රනාන්දු යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම ආගමික වැඩසටහනට විශ්‍රාමික මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ හා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනි බ්‍රිගේඩියර් ඩීටීඑන් මුණසිංහ යූඑස්පී, මධ්‍යස්ථාන සේනාවිධායක, කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ, යුද්ධ හමුදා රෝහල් අධ්‍යක්ෂ, සේවා වනිතා සාමාජිකාවෝ ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් 800 ක් පමණ සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්




4(සෙව්) යුධෝපකරණ බලකායේ හටපිරිස් එක්ව ඉකුත් ජූනි මස 27 වන දින වත්තේගම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දී පරිත්‍යාග වැඩසටහනක් පවත්වනු ලැබූහ. යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ඉරේෂා ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී එම ළමුන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් සහ ත්‍යාග පිරිනැමූ අතර, ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත විදුලි සලාක ඇසුරුම් සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදි. තවද, ළමුන් වෙනුවෙන් විනෝදාස්වාදජනක වැඩසටහනක් ද එහිදී පැවැත්විය.

# ඇස් කණ්ණාඩි පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්




විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ මඟපෙන්වීම යටතේ එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ඉකුත් ජූනි මස 28 වන දින ඇස් කණ්ණාඩි ලබාදීමේ සමාජ සත්කාරක වැඩසටහනක් පැවැත්විණ. එහිදී, අක්ෂි ආබාධවලින් පෙළෙන යුද්ධ හමුදා සහ සිවිල් සේවක මහතුන් 67 දෙනෙක් වෙත සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා ඇස් කණ්ණාඩි ලබාදුන්හ.

# දැනුම වර්ධනයට නව තෝතැන්නක්




ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී උදුලා කස්තුරිමුදලි මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2(සෙව්) සහ 3(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකා ඒකකයන්හි ඉදිකළ නව පුස්තකාල දෙකක් ඉකුත් ජූනි මස 16 වන දින විවෘත කෙරිණ. එහිදී, සියලු නිලයන් ආමන්ත්‍රණය කළ සභාපතිනිය පොත් කියවීම තුළින් දැනුම වර්ධනය කිරීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළ අතර, නව පුස්තකාල සඳහා වටිනා පොත් පරිත්‍යාගයක් ද සිදුකළාය. මෙම උත්සව අවස්ථාවට 2(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ අණදෙන නිලධාරිනී මේජර් එස්ජීඑම් ප්‍රේමතිලක, 3(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ අණදෙන නිලධාරිනී මේජර් එච්එච්එච් ද සිල්වා ඇතුළු එම බලකා නිලධාරීන් සහ සෙබළියන් පිරිසක් එක්වූහ.




## සුබ මොහොතින් රාජකාරි අරඹයි

යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනි ලෙස තුෂාරි අබේසිංහ මහත්මිය ඉකුත් ජූලි මස 15 වන දින එම රෙජිමේන්තු මූලස්ථානයේ දී සිය ධුරයේ රාජකාරි භාරගනු ලැබුවාය.

## මාසික මහසභා රැස්වීම සාර්ථකව අවසන්




යුද්ධ හමුදා පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාවේ සහ රයිෆල් බලකා සේවා වනිතා ශාඛාවේ මාසික මහසභා රැස්වීම ඉකුත් ජූලි මස 07 වන දින 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ නිලධාරි නිවස්නයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එච්ජී ස්වර්ණලතා මහත්මියගේ මූලිකත්වයෙන් පැවති මෙම මාසික මහසභා රැස්වීමේදී සොල්දාදුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති වත්මන් පියවර සහ ක්‍රියාත්මක කිරීමට නියමිත අනාගත ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කෙරිණි. මෙම අවස්ථාව සඳහා එම බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

## යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවෙන් රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





ගජසිංහපුර වෙඩිඩිකුලම් රජයේ රෝහලේදී රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජුනි මස 21 වන දින පැවැත්විණ. යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී වරුණි කුලතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන 4(සෙව්) යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එරන්ද ජයවර්න සහ එම භාර්යාව වන සමදරා මහත්මිය විසින් සංවිධානය කරනු ලැබූහ. වෛද්‍ය ඩබ්ලිව්එස්ජ් ප්‍රනාන්දු මහතා ඇතුළු රෝහල් කාර්යය මණ්ඩලය වැඩසටහන සාර්ථකව පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයූ අතර, එම ප්‍රදේශයේ යුද්ධ හමුදා භටපිරිස් සහ ප්‍රදේශවාසීන් 60 දෙනකු රුධිරය පරිත්‍යාග කිරීම සඳහා එක්වූහ. තවද, එම රෝහලේ නඩත්තු කටයුතු සඳහා අත්‍යවශ්‍ය පරිසර හිතකාමී විෂබීජ නාශක ලීටර් 100ක් පරිත්‍යාග කිරීම ද සභාපතිනියගේ සුරතින් සිදුකළාය.



ආධුනික සෙබළ සොබාසිරි 1990 මාන්කුලම් හිදී (දකුණු පස කෙළවර), සෙබළ සූරියබණ්ඩාර කළු සුදු ඇඳුමෙන්

පසුගිය කලාපයේ ඉතිරිය

මාන්කුලම සටනේ මතක ඉතිරි කළ...

# 33 වසක් පැරණි මාන්කුලම් සටනේ දිනපොත

යුද සමයේ සැඟවුණු කතාවක්

දින කිහිපයක් ඇවෑමෙන් සෙබළ සූරියබණ්ඩාර කෑගල්ල නගරය වෙත යන ලද්දේ එහි වූ ස්ටුඩියෝවෙන් තම ඡායාරූප ලබාගැනීමේ අරමුණිනි. එහිදී, ඔහුට 36 කොඩැක් සේයා පටලයෙන් මාන්කුලමට අදාළව පැහැදිලි තත්ත්වයේ ඡායාරූප විසිගණනක් ලබාගත හැකි විය. අනතුරුව ඒ සියල්ල නිවසට රැගෙන ගිය ඔහු ඒවා නරඹමින් රස විඳින්නට වූයේ බොහෝ මතක සිහිගන්වමිනි. එසේම, මියගිය තම සහෝදර සගයින් පිලිබඳ ඉතා දුක්බර මතකද එහි ඇතැම් ඡායාරූප දකිද්දී ඔහුව පෙළන්නට විය. කෙසේ හෝ එම ඡායාරූප ඇල්බමයක බහා නිවසේ සුරැකිව තබන්නට ඔහු අමතක නොකළේය.

මෙලෙස මසකට ආසන්න කාලයක් තම නිවාඩුව ගතකළ සෙබළ සූරියබණ්ඩාර යළි රාජකාරී සඳහා වාර්තා කරනුයේ වව්නියාවටය. ඒ වනවිට එම ප්‍රදේශයේ කඳවුරු කිහිපයකම රාජකාරී භාරගෙන තිබුණේ 3 සිංහ රෙජිමේන්තු භටපිරිස් විසිනි. කෙසේ නමුත්, එහිදී පෙර මාන්කුලමේ තමන් සමඟ කටයුතු කළ වැඩිදෙනකු ඔහුට හමුනොවීය. විශේෂයෙන්ම තමන් සතුව තිබූ ඡායාරූපවල දක්නට ලැබුණු සැරයන් උදේපාල, 2/ලුතිනන් ප්‍රසන්න ලියනගේ, සෙබළ නිමල් සිරිවර්ධන යන කිසිවකුත් එහිදී ඔහුට යළි මුණ නොගැසිණ.

මේ අතර සැරයන් උදේපාල ද සැලකිය යුතු කාලයක් රෝහලේ හා නිවසෙහි සිට ප්‍රතිකාර ලැබ යළි මන්නාරම වෙඩිතලතිව් ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරී සඳහා එක්විය. නමුත්, ඒ වනවිට ඔහු සුවය ලබා තිබුණද තුවාල සිදුවීම හරහා දැනෙන තරමේ බලපෑමක් තම දෛනික කටයුතුවලදී එල්ලවී තිබිණ. මෙලෙස තවදුරටත් දින සති මාස ගත විය. එම කාලසීමාව තුළ යුදබිම තුළ මෙන්ම ඔවුනොවුන්ගේ පුද්ගලික ජීවිත තුළ ද සිදුවූ වෙනස්කම් රාශියකි. මාන්කුලම් හා කොකාවිල් සිදුවීම් එලෙස අතීතයට එක්වෙද්දී සැරයන් මේජර්වරයකු ලෙස අනුපිළිවෙලින් උසස් ලැබූ උදේපාල 2010 අප්‍රේල් මස 14 වන දින යුද හමුදාවෙන් ඉවත් වනුයේ වෛද්‍ය වර්ග කිරීම් යටතේය. ඒ වනවිට දශක තුනක් තරම් දීර්ඝ

කාලයක් යුද හමුදාවේ සේවය කොට තිබූ ඔහුට එවක පැවති හටපිරිස් හිඟය මත නියමිත සේවා කාලය ඉක්මවාද හමුදාවේ ගතකිරීමට අවස්ථාව ලැබී තිබිණ.

ඉහත කොකාවිල් මාන්කුලම් සිදුවීම්වලට තවත් දශක කිහිපයක් ගතවිය. එතෙක් කිසිවකුගේ අවධානයට බඳුන්ව නොතිබුණු මෙම කථාවට යළි පණ ලැබුණේ එම සිදුවීමෙන් හරියටම වසර 28 කට පසුවය. එනම්, 2018 වර්ෂයේදී මා විසින් රචනා කොට එළිදක්වන ලද "අවි බිමක ගිනියම" නම් ග්‍රන්ථය හරහාය. ඊට පාදක වූයේ ඉහත සඳහන් කළ මාන්කුලම් හා කොකාවිල් ප්‍රහාරයට අදාළ වන සම්පූර්ණ කථාවය. ඒ වනවිට එම සිදුවීමට වසර 28 ක් ගතව තිබුණි. සමාජයට සහමුලින්ම අමතකව තිබූ එමෙන්ම යුද හමුදාව තුළ පවා වැඩි තොරතුරු සඳහන් නොවුණු එම සිදුවීම පිළිබඳ මවිසින් වසර තුනක අඛණ්ඩ ගවේෂණයක් සිදුකරන ලද්දේ සියුම් හෝඩුවාවල් ඔස්සේ පවා ඊට සම්බන්ධ ජීවතුන් අතර සිටින පුද්ගලයින් සොයා රටපුරා ඇවිදිමිනි.

එක්තරා දිනෙක පෙරවරුවේ කිසියම් අයකු එවකට මා සිටි කොස්ගම යුද හමුදා කඳවුරෙහි මාගේ කාර්යාලයට පැමිණියේය. ඒ 2016 වසරේය. ඉටි කවරයක බහාලූ පොතක් වැනි යමක්ද අතැතිව සිටි ඔහු කිසිවකු විසින් කළ දැනුම්දීමකට අනුව එලෙස පැමිණ තිබුණි. ඔහු නමින් 3 සිංහ රෙජිමේන්තුවට අයත් සැරයන් සූරිය බණ්ඩාර විය. කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවකු වූ ඔහු ඒ වනවිට ද පිදුරුතලාගල රූපවාහිනී සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ රාජකාරීන්හි නිරතව සිටි අයෙකි. ඊට පෙර කිසිදා හමු නොවී තිබූ ඔහු එහිදී මා හමුවේ ඉතා ආචාරශීලීව පැවසුවේ තමා 1990 මාන්කුලම් සිදුවීමට සම්බන්ධ සෙබළ සූරියබණ්ඩාර නම් අයකු බවය. 26 වසරක මතකයක්ද රැගෙන එලෙස ඔහු මා කරා පැමිණීම මා හටද මහත් ආස්වාදයක් විය. ඒ වනවිට එම කොකාවිල් මාන්කුලම් සිදුවීමට සම්බන්ධව මා විසින් මුලපුරා තිබූ ග්‍රන්ථයේ ඔහු ප්‍රධාන පාර්ශ්වකරුවකු වී සිටීම ඊට හේතුවයි. කෙසේ හෝ ඔහු හා පැය කිහිපයක් පුරා කතාබහ කොට ලබාගත් තොරතුරු සමුදාය පොතක් පිරෙන්නට තරම් විය.

අපගේ හමුව අතරතුර එතෙක් ඔහු සුරැකිව තබාගෙන සිටි ඉටිකවරය මා වෙත දිගු කළේය. එහි බහා තිබුණේ පැරණි CR පොතක් හා සේයා පටල (Negative) කිහිපයකි. ප්‍රමාණයෙන් පිටු 40 ක් තරම් වූ එම පොත කොතෙක් පරණ එකක් වීද යත් එහි පිටකවරය හා ඇතැම් කොළ දුර්වර්ණ වී පුස් අල්ලා තිබිණ. පොතෙහි පළමු පිටුව ඉංග්‍රිසි භාෂාවෙන් කිසියම් දත්ත රැසක් වගුවක ආකාරයට සටහන් කර තිබුණු අතර එහි ඉහල දකුණු කෙළවර "එල් හැත්රු ප්‍රනාන්දු", ගම්මාන 14, අංක 10, නල්ලච්චිය, තඹුත්තේගම ලෙස සඳහන් ලිපිනයක්ද විය.



සැරයන් සොබාසිරි
(එවකට ආධුනික සෙබළ)

දෙවැනි පිටුවේ සිට පිටු 15 ක් පුරා තිබුණේ කිසිවකුගේ අත් අකුරින් ලියූ තොරතුරු සමුදායකි එය මුලුමනින්ම 1990 මාන්කුලම් ප්‍රහාරය හා ඉන් පසුව කඳවුරේ දෛනික සිදුවීම් මාලාව පිලිබඳවය. මනරම් ලෙස අදහස් ගලපා පිළිවෙලට ලියා තිබු එහි කර්තෘ වී තිබුනේ "සොබාසිරි" නම් වූ ආධුනික සෙබළෙකි. " සර් මේක මාන්කුලමේ ඇටෑක් එක දවස්වල මගේ බංකරයේ ඉඳන් ආධුනික සෙබළෙක් ලිව්ව තොරතුරු තියන පොතක්" සූරිය බණ්ඩාර මා හමුවේ පැවසුවේ එම පොත හා බැඳී තිබුණු අපූරු කතාව දිග හරිමිනි.

මාන්කුලම් ප්‍රහාරයෙන් දින කීපයකට පසුව එහි උග්‍ර ආහාර හිගයක් මතුවන්නට විය. එහිදී, සෙබළ සූරියබණ්ඩාර පුෂ්පජිත් නම තවත් සෙබළකු සමඟ මාන්කුලම් කඳවුර ඉදිරිපිටට වන්නට වසා දමා තිබූ වී ගබඩාවකට ඇතුල් වනුයේ එහි සහල් හෝ වී ඇත්නම් රැගෙන යාම පිණිසය. ඒ වනවිටද ත්‍රස්තවාදීන් ප්‍රදේශය වටකොට සිටි බැවින් ඔවුනට එම ක්‍රියාව සිදු කරන්නට වූයේ ඉතා ප්‍රවේසමෙනි. විවෘත කළ ගබඩා සංකීර්ණයේ එක් කොටසක වී හා සහල් මිටි විශාල ප්‍රමාණයක් තිබිණ. මේ අතර සූරිය බණ්ඩාර එහි ඔබ මොබ ඇවිදින අතරේ ඔහුට එහි අල්මාරි ලාච්චුවක තිබී පිටු 40 ප්‍රමාණයේ සීආර් පොතක්

**"ත්‍රස්ත වෙඩි බලය අඩුවී ඇත. සෙබළ ගුණවර්ධන පැවසුවේ ඔහුගේ බංකරයේ කෝප්‍රල් කෙනෙක් හා සෙබළෙක් මියගොස් ඇති අතර, තවත් තිදෙනකුට බරපතල තුවාල සිදුවූ බවයි. පළමු බංකරයේ එක් සෙබළෙක් හා සිවිල් සේවකයකු බංකරය තුළම මියැදී ඇත. තවත් කවරින් පොයින්ට් එකක සෙබළකුගේ ඇඟට වැදුණු වෙඩි පහර ඉවසනු නොහැකිව අතේ රැඳි M 4 බෝම්බය පපුවේ තබාගෙන දිවිනසාගෙන ඇත"**

හමුවිය. බැලූ බැල්මට එය එම වී මෝලේ අයිතිකරු විසින් පරිහරණය කළ වී සටහන් පොත බැව් සෙබළ සූරියබණ්ඩාරගේ අනුමානය විය. කෙසේ හෝ ඔහු එම ගබඩාවට ඇතුළු වූ අවශ්‍යතාව ඉටුකරගන්නා අතරේ මෙම සීආර් පොත රැගෙන යාමටද කටයුතු කර තිබුණි. එසේ රැගෙන ගිය පොත ඔහු භාරදී තිබුනේ එම බංකරයේ සිටි ආධුනික සෙබළ සොභාසිරි වෙතය. එහිදී, දිනපතා කඳවුරේ සිදුවන තොරතුරු සියල්ල එහි සටහන් කළ යුතු බවට ඔහු සොභාසිරිට නියෝග පනවා තිබුණි.

රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවකු වූ ආධුනික සෙබළ සොභාසිරි මාන්කුලම් කඳවුරට පැමිණි දා සිට රාජකාරි කරනු ලැබුවේ සූරියබණ්ඩාර සමගින් එම බංකරයේමය. පෙර සිටම පුවත්පත්වලට පවා ලිපි නිර්මාණ යොමුකල සාහිත්‍ය රචනයට ඇල්මක් හා හැකියාවක් දැක්වූ සොබාසිරිට සූරියබණ්ඩාරගේ නියෝගය අඩුවමකට

වඩා ආස්වාදයකට හේතුවිය. එම නිසා ඔහු එම කටයුත්ත අපූරුවට ඉටු කලේය. (ඔහු එලෙස එම CR පොතෙහි ලියා තිබූ කොටසක මෙසේ දැක්වේ.)

"සඳ එලියෙන් මා වේලාව බැලුවේය. හරියටම පාන්දර 4.00 යි. RPG යට තවත් බෝම්බයක් කැවුවෙමි. ත්‍රස්ත වෙඩි බලයට RPG යෙන් පිළිතුරක් දෙන්නට බංකරයෙන් එළියට විත් ඇහැළ ගසට පිට දී අවට නිරීක්ෂණය කළෙමි. ප්‍රධාන ගේට්ටුව දෙසට ඉලක්කය ගත් අතර බංකරය තුළ සිටි මිතුරු සෙබළ දෙදෙනා ආවරණ වෙඩි සැපයූහ. හිත වෙර යොදා අවිය ක්‍රියා කරවීය. පරිසරයම සසල කරමින් මෝටාරය ඉදිරියේ පිපිරී ගියේය. විනාඩි ගණනක නිහඬතාවකින් පසු කඳවුර දෙසට මෝටාර් එල්ල වන්නට විය. ඒ අතරතුර පළවෙනි මුරකුටිය දෙසින් අපේ බංකරයට තදබල ප්‍රහාරයක් එල්ල වූයේය. අපේ ප්‍රතිප්‍රහාරයෙත් අඩුවක් නොවීය.

"පතොරොම්" සොයා යන අතරෙහි මම අපේ බංකරයට දකුණු දෙසින් ඇති දෙවැනි මුරකුටියට ඇතුල් වුණෙමි. දෙවියනේ අදහාගත නොහැකි දේ නම් සෙබළුන් හැමතැනම විසිරී වැටී ඇත. කෙනකුගේ කෙඳිරියකි. තවත් අයකු වේදනාවෙන් මියැදුනු සලකුණුය. පස් හය දෙනකු එතැනමය. සෙබළ සිතට දිරිය අරන් පිටවූයෙමි බංකරයෙන්. වටින් ගොඩින් එළිය වැටෙන සළකුණු පහළ වී ඇත. අසල බංකර්වල තොරතුරු සොයමින් සෙබළුන් එකා දෙන්නා කවර් එකේ ඇදීයයි. ත්‍රස්ත වෙඩි බලය අඩුවී ඇත. සෙබළ ගුණවර්ධන පැවසුවේ ඔහුගේ බංකරයේ කෝප්‍රල් කෙනෙක් හා සෙබළෙක් මියගොස් ඇති අතර, තවත් තිදෙනකුට බරපතල තුවාල සිදුවූ බවයි. පලමු බංකරයේ එක් සෙබළෙක් හා සිවිල් සේවකයකු බංකරය තුළම මියැදී ඇත. තවත් කවරින් පොයින්ට් එකක සෙබළකුගේ ඇහැට වැදුණු වෙඩි පහර ඉවසනු නොහැකිව අතේ රැඳි M 4 බෝම්බය පපුවේ තබාගෙන දිවිනසා ගෙන ඇත. එන තොරතුරු සියල්ලම හිත සසලකරයි. පෙර දයාබරව සුහදව සිටි මිතුරු සෙබළු පැය විසිහතරකටත් අඩු කාලයකදී අප හැර ගොසින්ය. දැන් මිනිසා පෙනෙන තරමට එළිය වැටී ඇත. බංකර් කවුලුවෙන් නුවන් යොමා පිටත බැලුවෙමි. යුද්ධයේ බියකරු බව කඳවුරම වෙලාගෙන ඇත. අතු ඉති විසිරී ඇත. තැන තැන වැටී ඇති මළකඳන්ය.

සූරිය බණ්ඩාරගෙන් ලද තොරතුරු ඔස්සේ එක්තරා දිනක මා උදෑසන මාවනැල්ලෙන් හැරී අරනායක ප්‍රදේශයේ පිහිටි නිවසක් සොයා ගියේ තවත් සෙබළු දෙදෙනකුද සමඟිනි. ඒ 2017 වසරේදීය. අතරමගදී කිහිප දෙනකුගෙන් තොරතුරු සනාථ කර ගැනීමෙන් අනතුරුව දුෂ්කර මාර්ගයක් ඔස්සේ එම නුපුරුදු පරිසරයකට ලඟාවූයේ අහම්බෙන් ලද හෝඩුවාවක් මත විශේෂ පුද්ගලයකු හමුවීම සඳහාය. නිවසට ආසන්නවත්ම එහි මිදුලේ සිටි වයස අවුරුදු 60 ක් පමණ වයසැති අයකු බොහෝ උනන්දුවෙන් අප දෙස විමසිලිමත් වනු පෙනිණි "මේ අර මාන්කුලමේ හිටපු සාජන් මේජර් උදේපාලද" මම ඔහුගෙන් විමසුවෙමි. කිසිත් නොදොඩා අංගචලනයෙන් පිළිතුරු දුන් ඔහු තුළ පැවතියේ කුතුහලයකි.

එහිදී, මා රැගෙන ගිය ඡායාරූපයක් ඔහුට පෙන්විය. "මේ ඉන්නේ උදේපාල නේද" මම ඔහුගෙන් විමසන්නට වූයේ මහත් උනන්දුවෙනි. ඔහු එක එල්លේම ඡායාරූපය දෙස බලා සිටියේ තැතිගත් අයුරිනි.

එහිදී, ඔහු තුළින් දිස් වූ විස්මය කොතෙක් ද යන්න මෙහි විස්තර කළ නොහැකි තරම්ය. ඔහු එක්වරම ඉස්තෝප්පුවේ වූ පුටුවකට බර වූයේය. 1990 ජුනි 15 වන දින අලුයම ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරය හමුවේ තුවාල ලැබූ තමන්ගේ ඡායාරූපයක් වසර 27 කට පසු එලෙස දැකීම ඔහුට අදහාගත නොහැකි විය. එසේම, එය එදවස තමන්ගේ කැමරාවෙන්ම කිසිවකු විසින් හෝ ලබාගෙන තිබීම එහි තිබූ තවත් විශේෂත්වයකි.

ඉතිරි කොටස ලබන කලාපයෙනි....



ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ




# ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පලකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක "රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර,
*ranaviruwa@yahoo.com*

# "මනෝවිද්‍යාත්මක වැඩමුළුව" සාර්ථකව අවසන්











යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මෙම වසරේ දෙවන අදියර යටතේ සංවිධානය කළ මනෝවිද්‍යාත්මක වැඩමුළුවක් පසුගිය ජූලි මස 15 දින සිට ජූලි මස 19 වන දින දක්වා පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ සඳහා යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරීහු 51 දෙනෙක් සහභාගී වූහ.

මෙම වැඩමුළුවේදී, මනෝවිද්‍යාව අර්ථකතනය කිරීම, ඉලක්කගත ප්‍රේක්ෂක විශ්ලේෂණය, මනෝවිද්‍යා මෙහෙයුම් ඉලක්ක සංවර්ධනය, ප්‍රචාරක විශ්ලේෂණය සහ ප්‍රතිප්‍රචාරණය, මනෝවිද්‍යාත්මක ක්‍රියාකාරකම් කෙරෙහි සංස්කෘතික උපායමාර්ගික බලපෑම, චිත්තවේගී තොරතුරු ඔස්සේ සමාජ මාධ්‍යයට වන බලපෑම සහ එහි හැසිරීම තුළින් මනෝවිද්‍යාත්මක මෙහෙයුම් කෙරෙහි ඇති වන බලපෑම ආදී කරුණු සාකච්ඡා කෙරිණ.

මෙම දේශන එම ක්ෂේත්‍රය සම්බන්ධව පුළුල් දැනුමක් ඇති යුද්ධ හමුදා නිලධාරීන් සහ සිවිල් ක්‍රියාකාරිකයින් විසින් මෙහෙවනු ලැබූහ. මෙම වැඩමුළුවේ සමාප්ති අවස්ථාව යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

# ජීවිතය දිනුමට මනෝවිද්‍යාත්මක දේශනයක්




ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) වෙතින් සංවිධානය කළ මනෝවිද්‍යාත්මක දේශනයක් පසුගියදා 4 කාලතුවක්කු හමුදා දේශන ශාලාවේ දී පැවැත්විණ. ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර එල්එස්සී විසින් මෙම දේශනය මෙහෙයවනු ලැබීය. රැකියාව සහ පුද්ගලික ජීවිතයේ සමතුලිතතාවය, මූල්‍ය කළමනාකරණය, විශ්‍රාම ගැනීමෙන් පසු ජීවිතය සහ පවුල් ජීවිතය ඇතුළු මාතෘකා රැසක් ආවරණය කරමින් පැවති මෙම දේශනය සඳහා නිලධාරීන් 12 දෙනෙක් සහ සෙසුනිලයන් 137 දෙනෙක් සහභාගී වූහ.



# වනදුර්ග, ජලදුර්ග
## අතරින්
# හරෝ හරා හඬ මැද්දේ
## කරපාදෙන් කතරගමට

නැකත එළඹෙනතෙක් සියලුදෙනා නොඉවසිල්ලෙනි. දින කිහිපයක් ඔකඳ දේවාල බිමෙහි පුදපූජා තබමින් රැඳී සිටින බැතිමතුන් දැන් වන මං මස්සේ ගමන ඇරඹීමට සූදානමිනි. නැකතට අනුව "කුමන" ජාතික වනෝද්‍යානයෙන් මහ වනයට ඇතුළුවන පාදයාත්‍රාව පළමු නවාතැන බවට පත් කරගනු ලබන්නේ බාගුරාව (බාගුරේ) නම් වූ සුන්දර විල්ලුවයි. කිඹුලන්, වන අලින් මෙන්ම කුළු හරකුන් ගහන මෙම විල්ලුව පළමු දින නවාතැන බවට පත් කරගැනීම සාමාන්‍ය සිරිත වුවද ජවසම්පන්න පිරිස් කණ්ඩායමෙන් මිදී තම පළමු නවාතැන ලෙස කුඹුක්නක් ඔය අසබඩ කුඩා කැබලිත්ත දේවාල බිම තෝරා ගනිති.

යාපනයේ සිට පැමිණෙන පිරිසට මෙම ගමන සඳහා දින දහයක හෝ ඊට වඩා කාලයක් ගත කිරීමට හැකි වුවද අනෙකුත් පිරිස මෙම ගමන දින හතරකින් නිමා කිරීමට සැලසුම් කරති. මෙම බැතිබර ගමන සඳහා දෙමල බැතිමතුන් මෙන්ම සිංහල බැතිමතුන්ද විශාල පිරිසක් එක්වන අතර ඇතැමුන් මෙම පාදයාත්‍රාව පරිසර වන්දනා ගමනක් බවට පත්කර ගන්නේ එහි ඇති මිහිරියාව හේතුවෙනි.

කිසිදු භාණ්ඩයක් මිලටගත නොහැකි මෙම ගමන සඳහා අවශ්‍ය ජල ගැලුමේ සිට බර කරට ගත් බැතිමතුන් වන විල්ලු, ජල දුර්ග, බඩවැටි, කාන්තාර බිම් පසු කරමින් සාමූහිකව ඉදිරියට ඇදෙන්නේ බජන් ගී නදින් වන අරණ පුරවාලමිනි. එසේම, මෙම ගමනේ ප්‍රධාන සලකුණු ලෙස හරෝ හරා යන නාදය භාවිත කරති.

එදා අතිශයින්ම දුෂ්කරවූ මේ ගමන අද වනවිට එදා පැවති තත්ත්වයට වඩා දුෂ්කරතා අවම වී ඇති බව කීවොත් නිවැරදිය. මේ ගමනේ දුෂ්කරතා අවම කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීමට දැන් විවිධ ආයතන ඉදිරිපත් වී සිටිති. ඒ අතරින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉටු කරන්නේ සුවිශේෂී මෙහෙවරකි. යුද්ධ හමුදාධිපති තුමන්ගේ උපදෙස් අනුව යුද්ධ හමුදාවේ 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් චමිල මුණසිංහ සහ 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් අනිල් පෙරේරා මේ වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරයි.

මේ ගමනේ අතිශයින්ම දුෂ්කර අදියර වන්නේ කුඹුක්කන් ඔය සිට ළිංතුන හරහා කටුපිල ආර දක්වා වූ කොටසයි. මේ ප්‍රදේශයද ආවරණයවන පරිදි යුද්ධ හමුදාව සියලුම බැතිමතුන් වෙනුවෙන් පානීය ජලය බෙදාහැරීම සිදුකරනු ලබයි. එසේම, යුද්ධ හමුදා වෛද්‍ය බලකාය සහ සිවිල් සංවිධාන සමඟින් පැය 24ම රෝහල් 05ක් ක්‍රියාත්මකවන අතර ඉන් සැලසෙන සේවය අතිමහත්ය. එසේම, යුද්ධ හමුදාවෙන් දායකත්වය දක්වන දන්සැල්ද මීට ඇතුළත්ය. කටගමුව රක්ෂිත පිවිසුම ආසන්නයේ ලබාදෙන දන්සැල ඉන් සුවිශේෂ ස්ථානයක් ගනී.

**ළිංතුන ප්‍රදේශයේ ක්‍රියාත්මක රෝහල නැගෙනහිර පළාත් සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ**

**සැලසුම්, ප්‍රජා සෞඛ්‍යය විශේෂඥ වෛද්‍ය අලගෙයියා ලතාහරන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වෙයි.**



"අපි සියලුම දෙනා මෙතන වැඩකරන්නේ ස්වෙච්ඡාවෙන්. අපිට මස්කෙළියේ ඉන්න බාලේන්ද්‍ර කියන ව්‍යාපාරිකයා මෙන්ම යුද්ධ හමුදාවෙත් උපකාර නොමසුරුව ලැබෙනවා. මුලින්ම මම මේ මෙඩිකල් කෑම්ප් එක කලේ ආර්මි වොලන්ටියර් විදිහට. අපි 2014 ඉඳන් මේ කෑම්ප් එක කරනවා. අපිත් එක්ක සිංහල වෛද්‍යවරු විශාල වශයෙන් එකතුවෙලා ඉන්නවා. එදා ඉඳල අපි හමුදාවත් එක්ක හොඳවිදිහට වැඩකරනවා. මෙතන යුද්ධ හමුදාව විසින් කරන හොඳ වැඩක් තමයි වතුර සපයන එක කවුරුහරි අතරමං උනොත් එයාව හොයාගන්න එකයි අපිට කට්ටිය අඩුවෙනකොට එයාලත් ඇවිත් වැඩ කරනව අපි එක්ක. මෙතන ඉඳල කුඹුක්කන් ඔය යන පාර ගොඩක් කල් ඉඳල හැදුවෙ නෑ. අපි ඇම්බියුලන්ස් එකක් විදිහට පාවිච්චි කරන්නේ ලෑන්ඩ්කෲෂර් එකක්. ඒකට යන්නත් බැරි විදිහට තමා පාර තිබ්බේ. මේ බව මම 12 වෙනි පාබල සේනාංකාධිපතිට කිව්වා. එතුමා මැදිහත් වෙලා අපිට මේ සැරේ හමුදාවෙන් පාර හදලා දුන්නා" යැයි කීවේය.

හරෝ හරා ස්වාමි හරෝ හරා... යන්න මෙම ගමනේදී සුබපැතුම් පාඨයක් ලෙස භාවිත වේ. අප සුබ දවසක් යැයි ප්‍රාර්ථනා කරන ආකාරයට මෙම ගමනේ එය හමුවෙන සෑම කෙනකුගේම මුවඟින් මතුවේ.

ඉඳහිට මුහුණට මුහුණ හමුවන සද්දන්තයන් මෙන්ම විශාල කුළු හරකුන් දුටු විගස බැතිමතුන් උද්වේගකර හඬින් "හරෝ හරා" යයි නද දෙති. වන සතුන්ගෙන් කිසිදු අතුරු ආන්තරාවක් නොවීමට මුරුගන් දෙවියන් තමා ආරක්ෂා කරන බවට බැතිමතුන් තදින්ම විශ්වාස කරති.

"හරෝ හරා" උච්චාරණය පිළිබඳ විවිධ මත පාදයාත්‍රාව සමඟ බැඳී පවතී. එක් නඩයක ඉදිරියෙන්ම ගමන් කරන්නා පළමුව හරෝ හරා යයි කී විට දෙවැන්නා එය යළි එය උච්චාරණය කරයි. මෙලෙස දස දෙනකුගෙන් යුත් කණ්ඩායමක වරින් වර හරෝ හරා යන හඬ දහයක් ඇසීම තුළින් ගමනේ මූලිකයා තම කණ්ඩායම සුරක්ෂිතව තමා පසු පස පැමිණෙන බව තීරණය කිරීම එක් කරුණකි. පාදයාත්‍රාව ඉතා වෙහෙසකර ගමනකි. එම ගමනේදී අවශ්‍ය ඔක්සිජන් නිරතුරුවම ලබාගැනීමට හරෝ හරා යන්න උච්චාරණය ඉවහල් වන බව පසු කාලීනව ගොඩනැඟුණු වෛද්‍ය මතයකි. කෙසේවෙතත් හරෝ හරා යන්න උච්චාරණය තුළින් ගමනේ වෙහෙස නිවෙන බවත් වන සතුන් සියලුදෙනා වන මඟින් ඉවත්වන බවත් විශ්වාසයයි.

පාද යාත්‍රාවේ යෙදෙන සියලු දෙනා සවස් යාමයට පෙර තම නිශ්චිත වන නවාතැන්පොළට පැමිණීම්ට වග බලා ගනිති. මෙම ගමනේ ප්‍රධානතම නවාතැන්පොළ කිහිපයකි. බාගුරේ, කුඩා කැබලිත්ත, ලිංතුන, කටුපිලආර, පරණ තොටුපළ සහ වරහන මෙම ප්‍රධාන නවාතැන් වෙයි. එම නවාතැනට පැමිණෙන ප්‍රධාන නඩය නවාතැනට යාබදව අතුපතර විහිදුණු රුක්ස ගසක් පාමුල දෙවියන් වෙනුවෙන් සංහිඳක් ඉදිකරති. කොහොඹ අතු වටකොටගත් මෙම සංහිඳ පාමුල එතැන්පටන් දෙවියන් වෙනුවෙන් විවිධ පුද පූජා පැවැත්වීමට සියලුදෙනා ඒකාවන්ව එක්වෙති. දෙවියන් වෙනුවෙන් මුරුතැන් පූජා තබන බැතිමතුන් ඉන් අනතුරුව තමාට ආහාර පිළියෙල කරති. රාත්‍රී ආහාරය ලබා ගැනීමෙන් අනතුරුව සිදුවන්නේ බජන් ගී ගැයීම වෙනුවෙන් සියලුදෙනා එක් වීමයි. මධ්‍යම රාත්‍රිය ගෙවී යනතෙක් බුම්මැඩි වයමින් රබන් නද කරමින් බජන් ගී ගයන බැතිමතුන් තමාගේ ජීවිතය දෙවියන්ට භාර කරමින් පැය කිහිපයක සුවදායක නින්දකට පසුව උදෑසනම ඇහැරී තම ගමන අරඹන්නේ දෙවියන් දැකීම ප්‍රධාන බලාපොරොත්තුව බවට පත් කර ගනිමිනි. මෙසේ දින ගණනාවක් එක දිගට යන ගමනේ දුෂ්කරම අඩවිය ලෙස සියලුදෙනා හඳුන්වන්නේ කුඹුක්නක් ඔය සහ ලිංතුන අතර ප්‍රදේශයයි. කුඩා කටු පඳුරු සහිත කිලෝමීටර හයකට නොඅඩු එම භූමිය වැලි කුණාටු සහිත එකකි. සිහින් වැලි තද සුළං සමඟ එක්ව ප්‍රචණ්ඩව ඇස් කෙවෙණි පසාරු කරන එම බිමේ ගමන දෙවියන් වෙනුවෙන් තම ජීවිතය කැප කරන බිම ලෙස බැතිමත්හු විශ්වාස කරති.

**පාදයාත්‍රාවට පානදුර සිට එක්වූ අසංගි අංජු වීරසූරිය සිය අත්දැකීම අපිට කීවේ මෙසේය.**



"දමිළ සංස්කෘතික පාගමනට අපිත් එකතු වුණා සිංහල ජනතාව වශයෙන් අපිත් ආසාවෙන් එකතු වුනේ. සිංහල සහ දමිළ ජනතාවත් එකක් සහයෝගයක් ඇතිකරන මේ පාගමන අපිට මේ විශාල





නැවුම් අත් දැකීමක්. දමිළ ජනතාව මේ ගමන අතරතුරදී අපිට හොඳින් සංග්‍රහ කළා. යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව වගේම වන ආරක්ෂක දෙපාර්තමේන්තුව අපිට මේ ගමනේ දී සහයෝගය දුන්නා. මම ආරාධනා කරනව මේ වගේ අත්දැකීම් විඳින්න මෙවර බැරි උනොත් ඊලඟ පාර හරි එන්න කියලා. මොකද ආරක්ෂාව සීයට සීයක් තහවුරුයි. දිවා රෑ නොබලා මේ නිලධාරීන් අපිට ආරක්ෂාව සපයනව අපි අතර ඉන්න දමිළ ජනතාවත් අපිට විශාල සහයෝගයක් දක්වනවා. අපි දමිළ සංස්කෘතිකාංග චාරිත්‍ර නොකෙරුවත් ඔවුන්ගේ ආගමික කටයුතුවල සම්බන්ධ වෙලා කටයුතුකිරීමට ලැබුණු අවස්ථාව භාග්‍යමත් අවස්ථාවක් ලෙස දකිනවා. ඇත්තටම මේ පාද යාත්‍රාව අතරතුරදී දැක්ක තවත් දෙයක් තමයි යුද්ධ හමුදාවෙන් ලැබෙන සහයෝගය. යාලට පැමිණි වෙලාවේ අපි දැක්ක යුද්ධ හමුදාව දිවා රෑ නොබල අලි කොටි වලස්සුන්ගෙන් පිරිච්ච මේ භූමියේදී පාදයාත්‍රාවේ නිරත පිරිසට ආරක්ෂාව සපයනවා. පාද යාත්‍රාවට පානීය ජලය සපයල විශිෂ්ට සෙවයක් ලබාදෙනව අපි සතුටු වෙනව යුද්ධ හමුදාවේ විශිෂ්ට සේවය ගැන" යැයි ඇය පැවසුවාය.

**මඩකලපුවේ සිට පාදයාත්‍රාවට එක් වූ දිනේෂන් අප සමඟ ළිංතුන ප්‍රදේශයේ දී දොඩමළු වූයේ මෙලෙසය.**

"මේ පාදයාත්‍රාව ඔකඳ දෙවාලෙ ඉඳන් තමා පටන්ගත්තේ. අපේ කණ්ඩායමේ 13 දෙනෙක් ඉන්නවා. පළවෙනි දවස කිලෝ මීටර් 8 ක් ඇවිත් රාත්‍රියේ අපි නතර වුනා. එතැන වෙනදාට වඩා හොඳට පහසුකම් තිබුණා කියලා අපේ වැඩිහිටියෝ අපිට කිව්වා. ඒ වගේම දෙවැනි දවස අපි නතර වුණේ කුබුක්කන පත්තනි දේවාලෙ ගාව. එතැනදිත් පහසුකම් සලසා තිබුණ විදිහ ඉතාම හොඳයි. ඊට පස්සේ අපි නතර උණේ මෙතන. මෙතනදිත් ඒ වගේමයි. අපි එන පාර දිගේ කිලෝමීටරෙන් මීටරේ වගේ වතුර ලබාදෙනවා. හමුදාවෙන් තමා ඒ දේවල් කරන්නෙත්. ඒ වැඩසටහන හරිම විශිෂ්ටයි".

**ළිංතුන ප්‍රදේශයේ දී අපට හමුවූ සුභද්‍රාදේවි රාජා අපට පැවසුවේ මෙවැන්නකි.**



"ඔකඳ දේවාලයෙන් අපි මේ ගමන පටන් ගත්තේ. ගමනේ මුල ඉඳලම අපිට වෙනදාට වඩා පහසුවක් දැණුනා. මොකද හමුදාවේ කට්ටිය වගේම තව තව කණ්ඩායම් අපිට පහසුකම් සපයන්න ඉදිරිපත් වෙලා හිටියා. පානීය ජලය සහ ආහාර සැපයීමේදී හමුදාව විශාල මෙහෙවරක් ඉටුකරනවා. පැය විසිහතරම ක්‍රියාත්මක වෙන රෝහල් පවා මේ වතාවෙ තියෙනවා. ඒක හරිම වටිනවා" යැයි සුභද්‍රාදේවි රාජා අප සමඟ පැවසුවාය.

මෙම ගමන පිළිබඳ අත්දැකීම් බහුල පිරිස් දෙවියන් පිළිබඳ බොහෝ කතාන්දර කියන්නේ රාත්‍රියේ ගිණිමැල සුව විඳින විටදීය. මෙම ගමන් මඟෙහි කතරගම දෙවියන් නිරතුරුවම වෙනස් වේශයකින් සැරිසරන බවට ඔවුහු විශ්වාස කරති. සුදු වේට්ටියකින් සැරසී සුදු තලප්පාවක් ඉහ වටා බැඳගත් සැරයටියක් අතින් ගත් ශාන්ත සෘෂිවරයකු ලෙස කතරගම දෙවියන් ජීවමානව හමුවූ පිරිස් පාදයාත්‍රාවට එක්වන්නකුට හමුවිය හැකිය. එසේ එකම වේශයෙන් එකම පුද්ගලයා තැන් කිහිපයක හමුවූ අවස්ථා පිළිබඳ කතාන්දර වේල් ස්වාමි ලියුම්කරු සමඟ පවසා තිබේ. මෙම ගමනේදී භයානක කුළු මීමුන් කල්ලි සුලභව මඟදිග හමුවන අතර වන අලින්ද ඉඳහිට හමුවෙයි. රාත්‍රි නවාතැන්පොළ අවට වලසුන් සහ දිවියන් ඉඳහිට දැකිය හැකි අතර කරවටක් ගිලී ගමන් කරනා ගංගාවල කිඹුලන් සිය ගණන් දැකිය හැකිය. නමුත් මෙම කිසිදු අයෙකු වන්දනාකරුවනට කිසිදු අනතුරක් සිදු නොකිරීම දෙවියන් දකින්නට යන බැතිමතුනට කරනු ලබන ගෞරවයක් බව සියලුදෙනාගේ විශ්වාසයයි.

ඒ අනුව ගත්කළ පාදයාත්‍රාව කතරගම දෙවියන් පිළිබඳ බැතිබර විශ්වාසයෙන්ම යන දුෂ්කර සුන්දර බැතිබර  ගමනකි. දේව බැල්මෙන් මෙම මඟට පිවිසෙන කිසිවකුටත් අනතුරක් සිදුනොවේ. වයස මාසයේ බිළිඳාගේ සිට වයස අවුරුදු අනූව දක්වා බැතිමතුන් පාද යාත්‍රාවේ දී ලියුම්කරුට මුණගැසී ඇත. මෙම සියලුදෙනා තුළම ඇත්තේ කතරගම දෙවියන් පිළිබඳ දැඩි විශ්වාසයකි. භක්තියකි. වන මං පසු කරමින් නාවල් අඩිය නම් තෙවන නැවතුමට පැමිණෙන බැතිමතුනට ඊළඟට හමුවන්නේ ජල දුර්ග සහිත මාර්ගයකි. කිඹුලන් බහුල මේ ජල තටාකයන්හි නේකවිධ සියොත්සිරින් පිරී තිබේ. කෙසේවෙතක් මේ ජල තල හරහා ගමන් ගැනීම අන්තරාදායක වන්නේ කිසිදුවිටෙක මිනිස් සේයාවක්. නොදකින දැවැන්ත කිඹුලන් විශාල වශයෙන් මෙම රාජධානියේ සිටිනා බැවිනි. නමුත් කිසිදු බැතිමතකු මේ ජලමං හරහා ගමන් කිරීමට බියක් නොදක්වති. කතරගම දෙවියන් තමා ඇතුළු කණ්ඩායම සුරක්ෂිත කරනු ඇති බව මේ සියලුදෙනා අදහති. පාද

යාත්‍රා සමයේ මෙම තුළානේ සියලු වැව්වල කිඹුලන්ට කඳ සුරිඳුන් විසින් තහංචි පනවන බවත් මෙම වැව්වල කිසිදු කිඹුලකුට හෝ කිසිඳු වන සතෙකුට මිනිසුනට අතුරු අන්තරාවක් සිදු කළ.නොහැකි බවත් මේ සුන්දර මිනිසුන් විශ්වාස කරති. එම නිසාම දහස් ගණනක් මිනිසුන් කිසිදු බියකින් තොරව මෙම වැව් තරණය කරන්න නමුත් සැබෑවටම කිසිදු මොහොතක ඔවුනට කිසිදු අතුරු අන්ත්‍රාවක් සිදුනොවීම මෙම දේව විශ්වාසය තහවුරු කරන්නකි.





තමා පාදයාත්‍රාවේදී දෙවියන්ගෙන් ඉල්ලාසිටින සියලු දේ නිසැකවම ලැබෙන බවත් එම බාරය නිදහස් කිරීමට පාදයාත්‍රාවෙන් දෙවියන් නැමදීමට යන බවත් ලියුම්කරු සමඟ පැවසූ පිරිස බොහෝය. ඔවුන්ගෙන් බොහෝදෙනා පාදයාත්‍රාව සමඟ හතලිස් වරකට වඩා සහභාගී වූ බැතිමතුන්ය.  මෙසේ දින ගණනක් මහවනමැදින් පැමිණෙන පාද යාත්‍රාව අවසානයේ කටගමුව වන උයන් පිවිසුමෙන් පිටව ගමනාන්තය වෙත ළඟාවේ. එසේ පැමිණෙන ඔවුහු රුහුණු කතරගම මහා දේවාලයේදී තම වතාවන්ට එක්වන්නේ දිනපතා පුද හරසර පවත්වමිනි.

රුහුණු කතරගම මහා දේවාලයේ පෙරහැර මංගල්ලයට පසුව මෙසේ පාදයාත්‍රා පුදපෙත් නිමකරන බැතිමතුන් එකිනෙකාගෙන් වෙන්වී තම ගම් බිම් කරා පිටවයන්නේ ලබන වසරේ හමුවීමේ බලාපොරොත්තුව සමගිනි. දින ගණනාවක් එක්ව එකම අරමුණකින් එකම මගක එන පිරිස වෙන්වීමේදී එකවර දැනෙන වෙන්වීමේ පාළුව පාදයාත්‍රාවට එක්වන සියලුදෙනා හොඳින් දනී. පාදයාත්‍රාව යනු දෙවියන් වෙනුවෙන් මිනිසුන් යන චාරිකාවකි.ජීවන චාරිකාව තරමටම කටුක, සුන්දර එම ගමනේදී දෙවියන් විසින් සැබෑ අව්‍යාජ මිනිසුන් මේ ගමනේදී එක් කරයි.



සටහන-:
ජනමාධ්‍යවේදී
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය හා මව්මේඅම

# ගාල්ල ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ සිසුන් සඳහා එක්දින තාක්ෂණික වැඩමුළුවක්





ගාල්ල ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ සිසුන් 59 දෙනකු සඳහා ඉකුත් ජූලි මස 18 වන දින කටුබැද්ද විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපලේ දී මෝටර් රථ එන්ජින් තාක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුවක් පැවැත්විණ. එම විද්‍යාලයේ විදුහල්පතිගේ ඉල්ලීම පරිදි මෙම වැඩමුළුව සංවිධානය කරන ලද අතර, යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීජ්අයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ජ්එන්ජේ ආරියසේන ගේ අධීක්ෂණය යටතේ එය සිදුකෙරිණ.

එම වැඩමුළුවේ දී, එන්ජින් ක්‍රියාකාරීත්වය, විදුලි පද්ධතිය, සිසිලන සහ ලිහිසි පද්ධතිය, මෝටර් රථ කර්මාන්තයේ භාවිතා වන විවිධ වර්ගයේ ලිහිසි තෙල් ඇතුළු එන්ජින් යන්ත්‍ර පිළිබඳ සිසුන් හට අවබෝධය ලබාදෙන ලදී. එහිදී, එම විෂයන් පිළිබඳ සිසුන් ඉමහත් උනන්දුවකින් තම අධ්‍යන කටයුතු සිදුකළ අතර, වැඩමුළුව අවසානයේ ඔවුන් විසින් වැඩපලේ කාර්ය මණ්ඩලය වෙත සිය කෘතඥතාව පළ කරන ලදී. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ් සිරිමාන්නගේ, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපල - කටුබැද්ද අණදෙන නිලධාරී කර්නල් ජේඑම්ආර් ජයසිංහ පීඑස්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.



# නිහතමානී නායකත්වය

"ජීවිතය" මෙලොව අපට ලැබී ඇති සොඳුරුතම වස්තුවයි. කොතෙකුත් ප්‍රශ්න අභියෝග හමුවේ ඉදිරියටම ගලාගෙන ඇදෙනා වූ දිය දහරක් වැනි මේ ජීවිතය විවිධ වූ සාරයන්ගෙන් අනූනය. එලෙසම ජීවිතය පූර්ණ වූත්, අර්ධ පූර්ණවූත්, නොපූර්ණ වූත්, එකිනෙකාගෙන් එකිනෙකාට වෙනස්වූත් අංගයන්ගෙන් සැරසී ඇති බවද සැබෑවකි. එසේ ඔබ මම ලැබූ ජීවිතය සරසන්නට මෙන්ම සැරසෙන්නට අපට ලැබී ඇති ආභරණයන් බොහෝමයි. අද අපි විමසමු ජීවිතයේ වටිනාකම තව තවත් විදහාලන මාන්‍යයෙන් තොර නිහතමානිත්වය, "නිහතමානී නායකත්වය" පිළිබඳව.

අපි මිනිසුන් ලෙස කුමන හෝ හැකියාවකින් උගත්කමින් පොහොසත් අයයි. එදිනෙදා දිවියේ දී ඔබට මට මුණගැසෙන දහසකුත් අයවළුන් ද මෙලෙස කී පරිදි මිනිස් වටිනාකම්වලින් පොහොසත් අයයි. මිනිසකු තුළ ගුණ මෙන්ම අගුණද පවතී. ඒ අගුණ යටපත් කරමින් ගුණ වනන්නට මෙලොව අපට ලැබී ඇති අනගි අවස්ථාවකි මිනිස් ජීවිතය. ඉතින් නායකයකු හෝ සේවකයකු වේවා, මේ සෑම අයකු හටම නිහතමානීත්වය යනු අවැසිම දීමනාවකි. ජීවිතයේ කිසියම් හෝ දිනක ඔබට නායකත්වය දරන්නට අවස්ථාවක් උදාවනු ඇත. උපන් දා පටන් මේ දක්වා ඔබේ ජීවිතය පිළිබඳ පසු විපරමක් කර බැලුවහොත් දහසක් අවස්ථාවන් වලදී ඔබ නායකයකු වී ඇති බව පසක් කර ගත හැක. ඉතින්, ඔබ නායකයකු වූ ඒ අවස්ථාවන් හීදී ඔබේ යටත් පිරිසට "නිහතමානී නායකයකු" වූයේද? ඔබේ ඒ නිහතමානීත්වය තුළ ඔවුන් ඔබ ඇගයුවේද? ඔබ නැතිවම බැරි වූ නායකයකු වූයේද? එසේනම්, ඒ සියලු තැන්හි ඔබ සැබෑම නායකයකු වී හමාරය. නායකයකු සතු වියයුතු අපරිමිත වූ ගුණාංග තුළින් කිහිපයක් පහතින් අප පෙලගස්වමු.

### කරුණීක වන්න...

කාරුණාවන්ත බව යනු සිත් නිවාලන ගුණයකි. මිනිසකු මිනිසකුට පමණක් නොව සියලු සත්වයන් හට කාරුණික විය යුතුය. විටෙක මනසින් උසස් අප අතර නොමැති කාරුණික හදවත් සත්ව ලොව තුළ පවා දැකිය හැක. ඔබ තවකෙකුට කාරුණික වන්නේ නම් අනෙකාද ඔබට ඕනෑම අවස්ථාවකදී කාරුණික වන බව නොරහසකි.

### සහයක් වෙන්න...

ඔබ එදිනෙදා රාජකාරි කටයුතු සිදුකර ගැනීමේදී එක පෙළක් ලෙස වැඩ ගොඩගැසී ඇත්නම්, ඒ අතර හදිසියේම නිම කළයුතු රාජකාරීන් ද ඇත්නම්, කවුරුන් හෝ තම සහයට සිටීම සුදුසු යැයි සිතෙනු ඇත. එලෙස කිසියම් හෝ අයකුට සහයක් වන්නට අවස්ථාවක් ඔබට ලැබුණේ නම් එය කිසි විටෙකත් නොසලකා හැරීම නම් වරදකි. මන්ද, ජීවිතයේ කෙදිනක හෝ අපට තවකකුගේ සහයක් සුළුවෙන් හෝ අවශ්‍ය නිසාවෙනි. එසේම, ඔබ සහය දැක්වූවෙක් යම් කිසි දිනෙක පෙරලා ඔබට සහය වනු නොඅනුමානය.

### තේරුම් ගන්න...

ජීවිතයේ ඕනෑම අවස්ථාවකදී තවත් අයකු ඔබට තේරුම් ගැනීමට ඔබට හැකි නම් ඔබේ නිහතමානීත්වයට තවත් අගයක් එක්වනු ඇත. ඔබ ජීවිතයේ පසු කරන සෑම අවස්ථාවක්ම ඔබේ හිතවතාද එලෙසම පසු කරනු ඇත. ඔබට හමුවෙන සෑම අයකු තුළම ඔබට පෙනෙනා සේම, නොපෙනෙනා බොහෝ දෑ ඇතිබව තේරුම් ගන්න.

### අගය කරන්න...

"කොච්චර නැහීගෙන වැඩ කරත් කිසිම වැඩක් නෑ, කිසිම හොඳක් නැනේ"

මේ වචන ඇහිලා නැත්නම්, මේ වචන ඔබට හිතිලා නැත්තම් ඔබව අගය කරන්නන් ඔබ අසල සිටිනවා විය හැක. නමුත්, එලෙස කෙනෙකු බලාපොරොත්තු වනවාටත් වඩා වැඩියෙන් යම් කාර්යයක් කළ පසුවත් කිසිදු ඇගයීමක් නැත්තේද නැත්තේම නොවේ. ජීවිතයේ සැම විටම යහපත් අයකු වන්නට උත්සහ දරන්න. නමුදු එය ඔප්පු කිරීමට කිසිම විටෙකත් මහන්සි නොවන්න. ඔබව වටින්නෝ ඔබ අගයනු ඇත. ඔබ අගයන්නෝ ඔබටද අගයක් එක් කරනු ඇත.

### අවස්ථානෝචිත වන්න...

නිහතමානී නායකයකු ලද යුතුම ගුණාංග යකි අවස්ථානෝචිත වීම. අනෙකාට අයහපත් වන සේ නොව, යහපතක් වෙන සේ අවස්ථානෝචිත වීම වටහාගත යුතුම කරුණකි. කිසිවකු කිසිවිටක අපහසුතාවට පත් නොවන අයුරින් අප කටයුතු කළ යුතුය. සියල්ලන්ටම පොදු ආත්මගරුත්වය නිති අපට ගැටෙන සැම අයකු තුළම සුරැකිය යුතුය. ඒ තුළින් ඔබට මනුෂ්‍යත්වයද ගොඩනැගිය හැකිය.

ඉතිං, ඔබෙන් වරදක් වූ විටෙක නිහතමානීව එය පිළිගෙන සමාව ඉල්ලිය හැකිනම්, ඔබෙන් සමාව අයදින්නකු තේරුම් ගෙන ඔබට සමාව දිය හැකිනම්, යම් කෙනකුට උදව්වක් අවැසි විට උදව්වක් වියහැකි නම්, ඔබ කෙනකුගෙන් උදව්වක් ලද විට "ස්තුතියි" යැයි නිහතමානීව පැවසිය හැකිනම්, ඒ ලද උදව්ව දිවි ඇති තෙක්ම ඔබේ මතකයේ ඇතිනම් මනුදම් සුරකින හෙටක් අපට ගොඩනැගිය හැකිය. ඔබ නායකයකු හෝ සේවකයකු වේවා, මේ ජීවිතයේ මානව්‍යයෙන් ලැබෙන දෙයක් නොමැති බව වටහාගත යුතුය.

මා ගෙන ආ මේ ලිපිය තුළින් මානයෙන් උදම් වී අයහපත් නපුරු දියඹකට නොයා නිහතමානීත්වයේ සොඳුරු වෙරළට පියමං කරනට මා ගෙන ආ එකඳු වදනක් හෝ ඔබේ **"නිහතමානී නායකත්වයට"** සවියක් වේ යැයි සිතමි.



සටහන-:
සෙ/ඩී103622
කාසෙ රෙජිනෝල්ඩ් එන්ඩී
පර්යේෂණ සංකල්ප හා මූලධර්ම
අධ්‍යක්ෂ මණ්ඩලය

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් දේශන මාලාවක්

යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ උපදෙස් හා මඟපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියර තුනක් පසුගිය ජූලි 24 සහ 31 යන දෙදින තුළදී පැවැත්විණ. ඒ යටතේ 12 වන පාබල සේනාංකය, ගැමුණු හේවා බලකාය යන ස්ථානයන්හි එම දේශන පැවැත්විණ.

එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" පිළිබඳ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදී. තවද, හමුදා සාමාජිකයින්ගේ සමාජමාධ්‍ය භාවිතය, ආර්ථික කලමනාකරණය, නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම ආදී කරුණු අලලා "අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් වූ දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු මේජර් එම්එච්එම්එස් බණ්ඩාර විසින් සිදුකරන ලදී.



"යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" යන මැයෙන් ඉකුත් ජූලි මස 24 වන දින 12 වන පාබල සේනාංක භටපිරිස් හි සහභාගීත්වයෙන් පැවති දේශනය



"අභිමානවත් සොල්දාදුවා" යන මැයෙන් මේජර් එම්එච්එම්එස් බණ්ඩාර විසින් ඉකුත් ජූලි මස 24 වන දින 12 වන පාබල සේනාංක මූලස්ථානයේදී පැවැත් වූ දේශනය



ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ජූලි මස 31 වන දින නිලධාරීන් හා සෙසුනිලයින් 333 කගේ සහභාගීත්වයෙන් පැවති "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" දේශනය

## දිනෙන් දින සමාජයෙන් නාය යන

# අපේ සිංහල ජන කවිය

ඉලෙක්ට්‍රොනික සමාජ ප්‍රවාහයක් හමුවේ මිනිසාගේ කලා රසඥතාවය හා සෞන්දර්යාත්මක හැඟීම් ද වැනැසී තාක්‍ෂණයේ මහිමයෙන් මිනිස් ජීවිතය යාන්ත්‍රීකරණය වෙමින් පවතී. රොබෝ මිනිසුන්ගෙන් සැදුම්ලත් සමාජ සංස්කෘතික ප්‍රවාහයක් තුළ දේශීය සමාජ ආර්ථික පසුබිම සීඝ්‍ර ව්‍යසනයකට ගොදුරු වුවද, අප සතුව පවත්නා සාම්ප්‍රදායික උරුමයන් යම් තරමින්වත් නොනැසී පවත්නේ එහි ඇති අව්‍යාජ බව නිසාය. අපේ සාම්ප්‍රදායික උරුමයන් අතර ජනකවියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ජනකවිය උසස් සාහිත්‍යයකට උරුමකම් නොකීවද එය ගැමියන්ගේ ජීවිතවල පැවති කටුක දුක්බදායී ජීවිතය පදනම් කරගෙන බිහිවූවක් නිසා එයට සුවිශේෂත්වයක් හිමිව තිබේ. කර්කශක දිවි පෙවෙතකට උරුමකම් කී ගොවියන්, කරත්තකරුවන්, ධීවරයන්, පතල්කරුවන් ආදී මෙකී නොකී කාර්යන්හි නියැලුනු ගැමියන් සිය අධ්‍යාත්මික හැඟීම් ප්‍රකාශනය කරනු වස් ජනකවි උපයෝගී කොට ගනු ලැබීය.

ජනකවි පැතිරීගිය අංශ ගණනාවකි. ඒ අතුරින් නැළැවිලි ගී, රබන් කවි, ශාන්තිකර්ම, බලිතොවිල් කවි, සෙත්කවි, වස්කවි, පාරු කවි, තේරවිලි, පිරුළු ආදියට වැදගත් තැනක් හිමිවිය. ගොවිතැන් කටයුතුවල නිරතවෙමින් අපිස් දිවියක් සරළ සුගම ලෙස ගතකළ ගැමියන් නූගත් වුවද, වියරණය, විරිත, පද භාවිතය, අලංකාරය, උපමා යනාදිය පිළිබඳ දැනුමක් නොතිබුණ ද, රසාස්වාදය පිළිබඳව පවත්නා නිසග රුචිය හා අදහස් මෙන්ම දෛනික ජීවිතය හා පැවතුනා වූ ඉරහඳ, පොලොව වැනි භෞතික වස්තූන්ට ඔවුන් ගරුකළ ආකාරයත් කවියෙන් ඉදිරිපත් කිරීමට ඔවුන් සහජ දක්‍ෂතාවයක් දැක්වූහ. මේ කවිය ඊට එක් උදාහරණයකි.

වරම් ගතිමි ඉරහඳ දෙවි අතින්     වරම්
වරම් ගතිමි මිහිකත් දෙවි අතින්     වරම්
වරම් ගතිමි සක්වල දෙවි අතින්     වරම්
වරම් ගොයම් කැපුමට දෙවිඳුගෙන්     වරම්

වර්තමාන සමාජය තුළ නැකැතට යමක් ආරම්භ කිරීමේ චාරිත්‍රය අද බොහෝදුරට යටපත් ව ඇත. නැකැත වෙනුවට තමන්ට සුවපහසු විවේකී මොහොතක් එතැන අරක් ගෙන තිබේ. එහෙත් කාලයේ පවත්නා සුභ අසුභ සැළකීමට ගැමි ජනතාව හුරුපුරුදුව සිටියේ පුරාතන මුතුන්මිත්තන්ගේ අවධියේ සිටමය. ඔවුන් සුභවේලාව යනුවෙන් හැඳින්වූයේ නැකැත් චාරිත්‍රයයි. මෙම නැකැත් ක්‍රමය විවිධ කලා නිර්මාණ තුළින් ඉදිරිපත් කිරීමට ඔවුන් සමත්වුණි. නැකැත කවියට මුසුකළ එක් අවස්ථාවකි මේ.


නැකැත් බලා වපුරන දින     නියමයි
සැපත් හොඳ සුභපල ගෙන     දීමයි
පිටත් කලා අටුවට     ගැනුමයි
ගෙනත් පොලා මැන වීදිය     දැමුමයි

දැඩි කාය ශක්තියකින් සිය ජීවන වෘත්තීන්හි යෙදුන ද මුදු මොලොක් හදවතක් ගැමියන් සතුව තිබුණි.

ඉරටත් හොරෙන් ඉර මුදුනින් ගිරව්     ගියා
අපටත් හොරෙන් පොඩි එතනා දීග     ගියා

යනුවෙන් පවසන්නට ඔවුන්ට හැකිවූයේ එබැවිනි. සැබැවින්ම පාරම්පරිකව පැවතුන ඒ වෘත්තීය (ධීවර, ගොවිකම්, පාරු පැදවීම) ඇතැම් පෙදෙස්වල අදත් දක්නට ලැබේ. එහෙත් එදා නගුලට හිමි වූ තැන අද ට්‍රැක්ටරයටත්, කුල්ලට, හුළං මෝලට, බෝල් අත්තට, පොරුවට හිමි වූ තැන වෙනත් විවිධ යන්ත්‍රෝපකරණ වලටත්, ඔරුවට පාරුවට හිමි වූ තැන පාලම් බෝක්කු සහ යන්ත්‍රානුසාරයෙන් දිවෙන මෝටර් බෝට්ටුවලටත්, පැල්කවි, සීපද කවි, පතල් කවි යනාදියට තිබූ තැන ගුවන් විදුලියටත්, කැසට්පටයටත් හිමිව තිබේ. එදා කමතේදී ඇසුණු,

මේ කාගේ මේ     කමතා
ඉරු දෙවියන්ගේ     කමතා
මේ කාගේ මේ     කමතා
සඳ දෙවියන්ගේ     කමතා



ආදී වශයෙන් ජනකවියට හිමිව තිබූ තැන අද අනේකවිධ වූ බොල් වදන් රැගත් හරසුන් ගීත සහිත කැසට්පට විසින් උදුරාගෙන තිබේ. එමෙන්ම, කමතට පමණක් විශේෂිත වූ වදන් සමූහයක් ද මේ ගොවිතැන සම්බන්ධව පැවතුනි. ඒ අතුරින්,

| | | |
|---|---|---|
| අම්බරුවා | - | හරකා |
| කොටන්නාව | - | උදැල්ල |
| රතඹල | - | ගින්දර |
| පැගිරියාව | - | බුලත්විට |
| යතුර | - | කුල්ල |
| කොළේ | - | ගොයම් ගොඩ |

යන වචන වැදගත් වේ. මේ වචන හඳුනන්නෝ අද කීදෙනෙක් නම් වෙත්දැයි සැකයකි. බැලූ බැල්මට ආගන්තුක වචන සේ හැඟුන ද මේ අපේ සිංහල භාෂාවට ආවේනික එක්තරා වචන සමූහයකි. මේ අයුරින් විවිධ වෘත්තීන්ට සීමා වූ තවත් වදන් බොහෝ ගණනක් වේ. එහෙත්, අපේ බාල පරපුර මේවා ගැන අබැටක තරම්වත් නොදන්නා තරම්ය. අදත් ජීවන වෘත්තිකාව ලෙස ගොවිතැන් කරන, හේන් වැඩකරන බොහෝ තරුණ කොටස් මේ පිළිබඳව නොදන්නා බව පිළිගත යුතු කරුණකි.

හේන් ගොවිතැන කළ ගැමියන් රාත්‍රී කාලයේ දී පැල් රකිමින් ජීවිතයේ අස්ථිරභාවය පිළිබඳ සිහිපත් කරමින් ඉච්ඡාභංගත්වයට පත් වූ ආකාරය, ඔහු පෙළෙන නිදිමත, කාන්සිය, වෙහෙස හා මුසුව ජනකවියට නැගුණ ආකාරය මේ කවි පෙළ තුළින් අපූරුවට නිර්මාණය වී තිබේ.


සාගතේ මොටද මිනිහෙක් හතෙන් නැති
මාවතේ මොටද ගමනට ඉඩක් නැති
රාමතේ මොටද මඟ පෙරළඑමක් නැති
ජීවිතේ මොටද නෑනා කෙනෙක් නැති

එමෙන්ම, පෙර සිංහල සමාජයේ ආවාහ විවාහ සිදුකිරීමට සුදුස්සන් තේරීමේ දී ඥාති සබඳතා රටාවට වැදගත් තැනක් හිමිව තිබිණ. මෙහිදී, පිළිගැනුනේ අවැස්ස නෑනා, මස්සිනා අතර විවාහයයි. එය අනුමත කරනු වස් නිර්මාණය වූ ජනකවි ද අපේ ජනකවි සාහිත්‍යයෙන් අහුලාගත හැකිය. මේ ඉන් එක් අවස්ථාවකි.

වැහිදිය අයති ගං හෝ ඇල සමුදුරටයි
මල්පැණි අයිති වටගුමු දෙන බඹරාටයි
මී රා අයිති කිතුලේ කළ වැද්දාටයි
නෑනි අයිති කාටද මස්සිනාටයි

මේ කවිය ඇරුණු කොට මේ සා විශාල වූ කවි සම්භාරයක් ජනකවි ආරේ විවාහය නම් චාරිත්‍රය වටා රොද බැඳී ඇත. එපමණක් නොව, මල්වරවීම, මඟුල් නැකැත් බැලීම යනාදී චාරිත්‍ර සඳහා ද විශේෂිත වූ කවි නිර්මාණය වි තිබුණ. අපේ පුරාණ මුතුන්මිත්තන් අවමංගල අවස්ථාවන් හිදී වෙස්සන්තර ජාතකය කියවීමත්, කාන්තාවන් ගැබ්බර අවස්ථාවන් හිදී අංගුලිමාල පිරිත කියවීමත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවල දී ඒ ඒ අවස්ථාවන් සඳහා සුවිශේෂ ජනකවි විශේෂයක් නිරිමාණය කරගෙන තිබුණ. ඒවා අතර අවුරුදු කෙළි සෙල්ලම් වන ඔන්චිලි පැදීම, ඔළිඳ කෙළීම, පංච දැමීම, එළුවන්කෑම යනාදී ක්‍රීඩාවන් සඳහා ගැයුනු ගී කැපීපෙනේ. එහෙත්, අද මේවා භාවිතවීම හා කියාත්මකවීම ඉතාමත් මන්දගාමී ස්වභාවයක පවතී. තරුණ කොටස් තුළින් මේ ජනකවි ගිලිහීයාමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ද භාවිතයේ පවත්නා දුර්වලතාවය යැයි හඳුන්වාදීම ද වරදක් නොවේ.

වර්තමානයේ දී මෙන් එදා ගැමි ජනතාව තුළ පංති විෂමතාවය. ධනේශ්වර පාලනය, අයිතිවාසිකම් යනාදිය පිළිබඳ දැනීමක් හැඟීමක් නොතිබුණි. එහෙයින් ගැටුමක් ද ඇති නොවුනි. ආගම විසින් ඔවුන් හික්මුණු දැහැමි ජීවිත ගතකරන්නන් බවට පත්කර තිබුණි. එහෙත්, ඔවුන්



අතර තිබු විඥාණවාදී මතවාදයක් වූයේ වෙන්න තිබෙන දේ වලක්වාලිය නොහැකියි යන්නයි. එයද, මෙසේ කවියට නැගුණු අවස්ථා දැකගත හැකි වේ.

සිරුවේ ඇවිත් ඉඳගෙන    පාරුවට
මාරුවේ හබල් අදිනවා    විටින්විට
පුරුවේ කරපු අකුසල්    ගෙවෙන්නට
පාරුවේ ඇවිත් දුක් දෙනවා    දැතට

එමෙන්ම, උපහාසය ගැබ් වූ ජනකවි ද අපේ ගැමියන් තුළින් නිරතුරුව එළිදැක්වුණි. ඒ අතරින් ප්‍රසිද්ධ ජනකවියකි මේ,

පෝයට සිල්ගෙන ගිංතොට    නැන්දා
ගෙයි පැදුරේ ඉඳ බණ රස    වින්දා
ගෙදර කෙල්ල ගෙයි මුට්ටිය    බින්දා
ඒකට ඒකිගෙ කෙස්ටික    සින්දා

විශේෂ ඉගෙනුමක් නොලැබුවද පතපොත ඇසුරු නොකළ ද, රිද්මය පිළිබඳ සැලකිලිමත් වී වෘත්තියට උචිත වචන භාවිතා කරමින් නිර්මාණය කළ ජනකවි අතර රබන් පද, විශේෂ තැනක් ගනී. මේ කවිය ඊට නිදසුනකි.

වත්තෙ නැන්දගෙ රෙද්දෙ    තුත්තිරි
සිද්ද පත්තිණි    දෙයියනේ
තිත්ත තිබ්බොටු තෙලෙන්    බැද්දත්
තිත්තමයි හැම    දෙයියනේ

කී රබන්පද එදා වැයුවේ හෙළ සිරිතට අනුව සුභ නැකැත් එළැඹෙන විටදීය. විවාහය, මල්වරවීම, අස්වනු නෙලා කිරිපූජා පැවැත්වීම ආදී චාරිත්‍රවිධි වලදීය. එහෙත්, අද රබන් පදයක් ඇසෙන්නේ සිංහල අවුරුදු උත්සවය නිමිති කොටගෙන ය. එයද දුෂ්කර ගැමි පෙදෙස්වල හා අවුරුදු කාලයේ දී ඒ වෙනුවෙන් විශේෂයෙන් නිෂ්පාදනය කෙරෙන වැඩ සටහන්වල දී පමණි. පාසල් විෂය ධාරාව තුළ නැටුම් විෂය ක්ෂේත්‍රය තුළට පමණක් "රබන් කවි" යනුවෙන් ඉතාමත්ම සරළ ලෙස කවි කිහිපයක් උපුටා දක්වමින් සිසුන්ට උගන්වනු ලැබේ. ඒ තුළින් සිදුව ඇත්තේ මේ කවි ඒ විෂයට පමණක් සීමා වී තිබීමයි.


අපේ සමාජ රටාව කෙතරම් කර්කශක දැයි පවසතොත් එදා නිවී සැනසිල්ලේ දරු නැලවිලි ගියක් ගයමින් තම දරුවා සුරතල් කළ මවට අද එසේ කිරීමේ අවස්ථාව අහිමි වී ඇත. ඇය අද පවුලේ පීචනබරට උරදීමේ කරතෘවයට එක්වී ඇත. අරුණෝදයත් සමඟ පිටත්ව මලහිරුත් සමඟ නිවසට ගොඩ වදින ඇයට සැබැවින්ම.

ඔන්න බබෝ    ඇතින්නියා
ගලින් ගලට    පනින්නියා
ගල් අරඹේ    සිටින්නියා
බබුට බයේ    දුවන්නියා

යනුවෙන් ගැයීමේ හැකියාවක් නැත. ඊට වේලාවක්ද නැත ඊට හැඩගැසුණු දරුවන් ද ගුවන් විදුලියේ හෝ කැසට් පටයේ ඇසෙන බයිලා රිද්මයට අනුව නැලැවී නැලැවී නිදි සුව විඳිති. එදා අපේ ගම්වල තිබුණු සංගීතවත් පරිසරය අද මුළුමනින්ම පිරිහී ගොස් ඇත. සිංහල සංස්කෘතියේ පමණක් නොව සෑම සංස්කෘතියකම ජනකවි සම්පදායක් තිබේ. එහෙත්, ඒ අතුරින් සිංහල ජනකවියට වැදගත් තැනක් හිමිවුණි. ඊට ප්‍රධාන හේතුව වූයේ ඒ ඒ කාරයන්ට ගැලපෙන අයුරින් කවියක් ඒ මොහොතේදීම නිර්මාණය කරන්නට තරම් තියුණු හැකියාවක් ගැමියාට තිබිමය. එපමණක් ද නොවේ. ඔවුන් මෙම ජනකවියට ගුරුවූයේ ළදරු වියේ පටන්මය. ස්වකීය වැඩිහිටියන්ගේ ඇසුර මේ සඳහා ඔවුන්ට පිටුවහලක් වුණි. එහෙයින් ළදරුවා ගැටවරයක් වනවිට සෑහෙන තරම් ජනකවි සම්භාරයක් ඔහු දැන සිටීමේ ප්‍රවනතාවයක් තිබුණි. එහෙත්, අද කාලය හා කාර්යභාරය විසින් දරුවාත්, වැඩිහිටියාත් අතර විශාල පරතරයක් ඇතිකර තිබේ. මේ නිසා ඇතිවී තිබෙන සෝදාපාළුව නිසාම වැඩිහිටියන් තුළින් යමක් ඉගෙන ගැනීමේ වරපසාදය ඔවුනට අහිමි වී තිබේ.

*ඉතිරි කොටස ලබන කලාපයෙන්...*

*වරුණි කෝකිලා ද සිල්වා විසින් රචිත "අස්වැන්න" කෘතියෙනි.*





# දෙමළුන් රැකගත් සිරි ගෞතම දළදාව

බුදුරජාණන් වහන්සේ නමැති අද්විතීය චරිතය මුල් කරගෙන ලොව පුරා පැතිර ගිය පාරිශුද්ධ දහම බුදුදහම නම් වේ. එම බුදුදහම වැලඳ ගත්තවුන් එකී අද්විතීය පුරුෂ රත්නය වූ ගෞතම බුදුන් වහන්සේගේ පාරිභෝගික භෞතික වස්තුවක් පවා පූජනීය කොට සලකත්. එවන් පසුබිමක බුදු රජුන් වදාළ අසූ හාරදහසක් ධර්මස්කන්දයෙන් පහස ලැබුවා වූ, ශ්‍රී මුඛය තුළ පිහිටා තිබුනා වූද දළදා වහන්සේව ඔවුන් තම දිවි දෙවෙනි කොට සලකති. පුද සත්කාර කරති. එම අති මහත් ගෞරවය වනාහී දන්තයක් වූ එම වස්තුව ආමන්ත්‍රණය කිරීම උදෙසා "දන්ත ධාතූන් වහන්සේ", "දළදා වහන්සේ", "දළදා හාමුදුරුවෝ" යන අති ගෞරවාර්හ වචන භාවිතා කිරීමෙන්ද, එම දළදා වහන්සේ උදෙසා සක්විති රජෙකුට මෙන් පුද පූජා, මහ දන්, පෙරහැර ආදිය කිරීමෙන් ද අපට පැහැදිලි වේ.

එවන් ගෞරවාදරයට පත්වී සිටින්නා වූ උතුම් දළදා වහන්සේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ සමයේ දී කළිඟු රටේ සිට හේමමාලා සහ දන්ත කුමරුන් විසින් අප සොඳුරු දීපයට වැඩම කරවූ බව අප දනිමු. එකල පටන් ගෞතම බුදුරජාණන් වහන්සේගේ උතුම් දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය බවට පත්විය. පාලකයා රජු ලෙස අභිශේක ලැබීමට ඔහු සතුව දළදා වහන්සේ වැඩ හිඳීම අනිවාර්ය විය. එබැවින් දළදා වහන්සේ ආරක්ෂා කරගැනීම රජුගේ පරම යුතුකම ද විය. දළදා වහන්සේ තමා සන්තකයේ නොමැති කල්හි තම සිහසුන පවා ප්‍රශ්නාර්ථයක් වීමේ අවදානමකට එකල පාලකයා පත් විය. එයට හේතුව නම් දුරාතීතයේ පටන් මෙරට බහුතරක් ලෙස වාසය කරන බෞද්ධයින් තම මුදුන් මල්කඩ ලෙස දළදා වහන්සේව සැලකීමය.

මෙවන් සංස්කෘතික, ආගමික පසුබිමක, අනුරාධපුර 5 වන මිහිඳු රජ සමයේ දරුණු සොළී ආක්‍රමණයක් සිදුවිය. එම ආක්‍රමණයෙන් ජය ලැබූ සොළීන් වසර දහසකට අධික කාලයක් මුළුල්ලේ ලංකාවේ අගනුවර වූ අනුරාධපුරය අතහැර දමා ඒ වෙනුවට පොලොන්නරුව තම අගනුවර කරගනිමින් තම පාලන කටයුතු සිදු කළෝය. මෙම කාලවකවානුවේ රුහුණේ උපන් කිත්ති කුමාරයා මහා සංග්‍රාමයකින් පසු ආක්‍රමණිකයින්ගෙන් රටම මුදවාගෙන මුලු දීපයම එක් චත්‍රයක් යටතේ පාලන කටයුතු සිදුකරනු ලැබූනි. ඒ මහා රජු විසින් විජයාරාජපුර යැයි නම් කරනු ලැබූ හැඳින්වූ පුලතිසිපුරයේ දළදා මළුව නම් මනරම් විහාර සංකීර්ණයක් තනා එහි අති ජූජනීය පාරිශුද්ධ දළදා වහන්සේ වඩා හිඳුවා පුද සත්කාර කරනු ලැබීය.

මෙකල දකුණු ඉන්දියාවේ බලවත් රාජ්‍යයක් ලෙස සොළීන් පත්ව සිටියෝය. එම සොළීන් සතුව ඉතා සුවිශේෂී හමුදා කණ්ඩායමක් විය. ඔවුන් නමින් "වේලක්කාරයෝය". ඔවුන් රජුගේ සහ රාජකීයන්ගේ ජීවිතාරක්ෂකයින් වූහ. අතිශයින්ම කාර්යශූර, සටන්කාමී මෙම හමුදා භටපිරිස් එඩිතර බවට උපන් හපන් වූහ. අප මහා රජු වූ මහා විජයබාහු නිරිඳාණන් තම ජීවිතාරක්ෂාව පිණිස පමණක් නොව, තම රාජ්‍යත්වයේ සංකේතය වන උතුම් දළදා වහන්සේ රැකගැනීමේ ඉමහත් වූ භාරදූර වගකීම දමිළ ජාතික එඩිතර වේලක්කාර හමුදාවට භාරදුන්හ. කිසිවකු විසින් දළදා වහන්සේ පැහැරගනී නම් ඔහු තමන් රජු යැයි පැවසිය හැකි පසුබිමක් තිබූ එකල සිංහල මහ රජු තම දිවියේ සහ තම රාජ්‍යත්වයේ සංකේතය දමිළයින් වෙත පැවරීම තුළින් එකල සිංහල දෙමළ යන දෙජාතිකයින් කෙතරම් සමගිව, අවබෝධයකින් යුක්තව සහෝදර ප්‍රේමයෙන් ගතකරන්නට ඇත්දැයි අපට සිතාගත හැකිය.

විජයබාහු රජුගේ 30 වන පාලන වසරේ දී සොළීන් සමඟ ඇති වූ යුදමය ආරවුල් සඳහා වේලක්කාර හමුදාව තම දායකත්වය දැක්වීමට විරුද්ධ වූහ. ඒ කරුණින් රාජ උදහසට ලක්වූ වේලක්කාර හමුදාව රාජ්‍ය සේවයෙන් නෙරපන ලදහ. වසර 55 ක් රාජ්‍ය පාලනය කළ මහා විජයබාහු රජුතුමාගේ 73 වන වසරේ දී මිය පරලොව යෑමෙන් පසු ලක්දිව ඇති වූ බල අර්බුද හමුවේ දළදා වහන්සේ ආරක්ෂා කරගැනීම මහා සංඝරත්නයට මහත් අභියෝගයක් විය. මෙවන් මහත් වූ දේශපාලනික අස්ථාවර හා අරාජික සමයෙහි දළදා වහන්සේගේ භාරකාරීත්වය උතුරු මූල රාජගුරුවූ මහා ව්‍යාකරණී මොග්ගල්ලාන තෙරුන් විසින් දමිළ වේලක්කාර හමුදාවට භාරදෙන ලදී. (ඉතාමත් පුදුම සහගත මෙම සිදුවීම වේලක්කාරයින් විසින් ශිලා ලේඛණ ගතකරනු ලැබිණි) රාජකීයන් විදේශිකයින්, ආක්‍රමණිකයින් යන සියල්ලන්ම දේශපාලනික බල අරගලයක යෙදී සිටි අවස්ථාවක, වස්තුව උදෙසා බොහෝ විහාර මංකොල්ලකෑම්වලට ලක්වූ එවැනි අවස්ථාවක රාජ උදහසට ලක්ව රාජ්‍ය සේවයෙන් නෙරපන ලද දමිළ හමුදාවකට රාජ්‍යත්වයේ සංකේතය වූ, බෞද්ධයින් තම දිවි දෙවෙනි කොට සලකන අතිඋතුම් දළදා වහන්සේගේ භාරකාරත්වය අනෙකකු නොව මහා සංඝයා විසින්ම ලබාදීම වනාහි අතිශයින්ම ආශ්චර්යමත්ය, අද්භූතය. මොහොතක් සිතා බලන්න සිංහල දමිළ අප කෙතරම් අවබෝධයකින් සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකින් ජීවත් වූයේ ද යන වග. සැබෑ ජාතික සංහිඳියාව විදහා දක්වන මෙම සෙල්ලිපියේ අන්තර්ගතය පහත දැක්වෙන පරිදිය.

කාලය :- විජයබාහු රජුගේ අභාවයෙන් පසු (ක්‍රි:ව: 12)
අක්ෂර :- ග්‍රන්ථාක්ෂර හා සිංහල
භාෂාව :- සංස්කෘත මිශ්‍ර දෙමළ
ප්‍රමාණය :- 8x2" උස  2x6" පළල
පේළි :- 49



වේලක්කාර සෙල්ලිපිය

මහා විජයබාහු රජු විසින් සේනාධිපති නගරගිරි දේව ලවා ඉදිරකරවන ලද දළදා මාලිගාව ද ඒ අවට ගොඩනැගූ සිද්ධස්ථාන ද වේලක්කාර හමුදාව විසින් කල්ප අවසානය දක්වා ආරක්ෂා කළ යුතුම වේ.

බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා...

මේ සමෘද්ධිමත් දිවයින වූ ලංකාවේ ඉශ්වොකු පරපුරෙහි උරුමක්කාර වූ සූර්ය වාංශික විජයබාහු රජු බොහෝ සතුරන්ට විරුද්ධව යුද්ධ කොට ජයගෙන අනුරාධපුරයට ගියේය. ඉන් අනතුරුව භික්ෂූන්ගේ ඉල්ලීම පරිදි බුද්ධාගම ආරක්ෂා කර ගැනීම පිණිස ඔටුනු පැළඳීය. අරමාණයෙන් (බුරුමයෙන්) භික්ෂූන් ගෙන්වා තුන් නිකාය පිරිසිදු කළේය. ලංකාව එක්සේසත් කළ විජයබාහු රජු දසරාජ ධර්මයන්ගේ රජකම් කරමින් තුන් නිකායටම තෙවරක් තුලා භාරදී (තමාගේ බරට සමාන වූ ධන පරිත්‍යාග කර) 55 වසරක් රජකම් කළ අතර, හැත්තෑ තුන් වසරක් ජීවත් විය.

අභයගිරියේ උත්තර මූලයෙහි වැඩ හිඳි දළදා හා පාත්‍ර ධාතූන් වහන්සේලා විජය රාජපුරය නම් පුලතිසි පුරයට රැගෙන ඒමෙන්  අනතුරුව දළදා මාලිගාවේ ස්ථිරව තැන්පත්  කරන ලදී. මෙම දළදා මාලිගාවේ තැන්පත් කර ඇති විශාල බුද්ධ ප්‍රතිමා වහන්සේගේ නේත්‍ර ගල්වා අංජන තැවරීමේ උත්සවය වසරක් පාසා පවත්වනු ලබයි.




*පොලොන්නරුව දළදා මාලිගයෙහි දළ සැලැස්ම*

උත්තරමූල වාසි ශික්ෂාකාමී උගත් රාජගුරු වූ මොග්ගල්ලාන තෙරුන් රාජමාත්‍යාදීන් පිරිවරාගෙන මෙම ස්ථානයට වැඩමකර අප කැඳවා, දළදා මාලිගාව ඔබලාගේ භාරයේ තිබුය යුතුය, යි වදාළ සේක. ඉන් අනතුරුව අපගේ වැඩිමහල්ලන් සහ නායකයින් සමඟ කථිකා කොට මෙම පුණ්‍ය භූමියේ නාමය "වේලක්කාර සේනාවන්ගේ  දළදා මහා විහාරය" ලෙස නම් කර එය අප භාරයේ පාරිශුද්ධ පුණ්‍යායතනයක් ලෙස පවත්වාගෙන යායුතු යැයි තීරණය කරන ලදී. මෙම පුණ්‍ය භූමියේ ආරක්ෂාව පිණිස හමුදා කණ්ඩායම් තුනෙන් එක් භටයකු බැගින් සැපයීමටත් ඔවුන්ගේ නඩත්තුව සඳහා එක් අයකුට එක වේලි ඉඩමක ප්‍රමාණයක් දීමටත් තීරණය විය. විහාරයට අයත් ගම්බිම්ද, සේවකයින්ද එසේම අභය පතා මෙම ස්ථානයට ඇතුල් වන්නන්ද අපි ආරක්ෂා කරන්නෙමු. අපගේ පරම්පරාව පවතින තාක් කල් අප දැනටමත් මුහුණ දී ඇති ව්‍යසනයට වඩා දරුණු ව්‍යසනයකට මුහුණ පෑමට සිදුවුවද අපගේ දිවි හිමියෙන් මෙම ව්‍යායාමය අප විසින් සිදුකරනු ඇත.

ඉරහඳ පවතින තුරු මෙම කාරණය සහතික කිරීම සඳහා අප විසින් තඹපතක ලියා (මුගලන් තෙරුන් වෙත) භාරදී මෙලෙස ශිලා ලේඛණයද පිහිටවනු ලැබිණ. ඒ අනුව මෙම (එකඟතාවය) උල්ලංඝනය කරන්නකු හෝ එසේ කිරීමට අනුබල දෙන්නකු, අපගේ සතුරකු වේ. ඒ තැනැත්තා මහාතන්ත්‍රයට විරුද්ධව අපරාධයක් කළා වේ. පස්පව් කළා වේ. බුදුරජුන්ට පිදු දෙය සොරකම් කළ පව්කාරයකු වේ. හේ රත්නත්‍රයට විරුද්ධව මහා අපරාධයක් කළා වේ. ඔහු නිරයට යන්නේය.

සැබවින්ම මෙය පුදුම සහගත ලේඛණයක්යැයි ඔබට සිතෙනු ඇත. මහා සංසරත්නයේ අතිශයින්ම විශ්වාසයට පාත්‍ර වූ දමිළ පිරිසක් ? රාජ්‍යත්වයේ සංකේතය ආරක්ෂා කරදෙන මෙන් ඉල්ලා සිටිය හැකි තරම් විශ්වාසදායි පිරිසක් ? සැබවින්ම මෙය පුදුමයක් නොවේ. දුරාතීතයේ පටන් සිංහල දමිළයින් වන අප එක්ව සහෝදරයන් ලෙස ජීවත් වන්නෙමු. බොහෝදුරට සමාන සංස්කෘතිකාංග ඇතිව ජීවත්වන අප දෙපිරිස ඈත අතීතයේ පටන් එකිනෙකාට උදව්කර ගනිමින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් යුතුව ජීවත්ව ඇත්තෙමු.

මේ කරුණට නිදසුනක් ලෙස පහත සඳහන් සිදුවීම දැක්විය හැක. 1915 දී ලංකාවේ ඇති වූ ජාතිවාදී අරගලයේ දී සිංහල ප්‍රබල දේශපාලන නායකයන් වූ ඩී.එස්. සේනානායක, ඩී.ආර්. විජේවර්ධන, ඊ.ටී. ද සිල්වා, දොස්තර හේසියස් පෙරේරා, එෆ්.ආර්. ඩයස් බණ්ඩාරණායක ඇතුළු තවත් පිරිසක් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අත්අඩංගුවට ගනු ලැබූහ. ඒ අතර සිටි කිහිප දෙනකුට මරණ දණ්ඩණය නියම විය. එම අවස්ථාවේ පොන්නම්බලම් රාමනාදන් නම් දමිළ නීතිඥයා බ්‍රිතාන්‍ය රජයට විරුද්ධව දැවැන්ත සටනක් දියත් කළේය. එම සටනේ ප්‍රතිඵලයක් ලෙස නිදහස ලබා මව්රට පැමිණි සිංහල නායකයින් රාමනාදන් නම් දෙමළ තරුණයාව ඔසවාගෙන ඔල්වරසන් දිදී ගාලුමුවදොර වටා පා ගමනේ ගිය බවට ඉතිහාසයේ සඳහන් වේ. නෙතඟ තුටු කඳුළු එක්කරන මෙවැනි සිදුවීම් අප ඉතිහාසයේ බොහෝය. අප රටේ එක් එක් අවධිවල ඇති වූ ගැටුම්, අසමගිකම් නිසාවෙන් අප අතර තිබූ සමගිය සහ අවබෝධය පලුදු වී ඇති බව මෙම සිද්ධීන් තුළින් පැහැදිලි වේ. නමුත්, ඓතිහාසික සිදුවීම් තුළින් මනාව පැහැදිලි වන්නේ ජාතීන් වශයෙන් සහ අප රටේ එක් එක් අවධිවල ඇති වූ ගැටුම්, අසමගිකම් නිසාවෙන් අප අතර තිබූ සමගිය සහ අවබෝධය පලුදු වී ඇති බව මෙම සිද්ධීන් තුළින් පැහැදිලි වේ. නමුත්, ඓතිහාසික සිදුවීම් තුළින් මනාව පැහැදිලි වන්නේ ජාතීන් වශයෙන් සහ ආගමික වශයෙන් ඉතා සමීප සබඳතාවයන් අප අතර තිබුනු බවකි. එම නිසා තවදුරටත් ශ්‍රී ලංකාද්වීපයේ අනන්‍යතාවය ලාංකිකයන් වන අප සැවොම එකතු වී ආරක්ෂා කරගැනීමට දිවිහිමියෙන් කටයුතු කරමු. නැවතත් එකා මෙන් නැගී සිටිමු. අතීතයෙන් ආශීර්වාද ගෙන අනාගත කරා අත්වැල් බැඳ ගනිමු.



*සටහන :*

***ලක්මිණි රාධිකා***

*Ambassodor of Education (Spelized in Translation)*
*Sworn Translator, Language Facilitator,*
*Justice of Peare (WI)*



# සෙබළ සිතුවිලි

## බිරිඳ...

ගැහැනියක වී ඉපිද ඔබ
ජීවන සටන සමගින් පොරබදමින්
සහකාරිය වී අත්වැල් බැඳන් ආ ගමන
මේ භවයේ නිමාකොට ඔබ
පතමි මම පුරුෂයකු වී ඉපදෙන්න
මතු ආත්මයේ දී නිශාදි නුඹ

සෙ/427749
කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ
12 ගැහේබ

## විකසිත වන්නට...

පාට පාටින් වනේ වනමල් පිපී සුළඟට වැනෙනවා ඇති
පුදසුනට යන්නට නොවේ ඒ කැලේ පාළුව මකන්නට වෙති

ඉද්ද වතුසුදු අරලියා මල් සුවඳ පුරවාගෙන පිපෙන්නැති
කොහේ කොහි හෝ පුදසුනක් මත මලින් උත්තමයන් පුදන්නැති

කියා තදකර වෙලා නූලක සුදු පිච්ච මල් වැල් ගොතන්නැති
උනා වරලස හැඩ කරන්නට මල් වැලක් ලඳුනට හැඩට ඇති

පාට පාටට ලස්සනම මල් සේලෙ පාටට ගලපන්න ඇති
අරන් පොකුරට දමා හැඩ වැඩ මනාලියකගෙ අතේ ඉන්නැති

රෝස කිව්වට පාට පාටට නටුවෙ කටුමුත් මල් පිපෙන්නැති
යහනෙ ලගිනා මුල් මඟුල් දා සයනෙ මල්පෙති විසි කරන්නැති

රෑම පිපිලා සුවඳ විහිදන් මහ පාන්දර පරවෙන්න ඇති
රෑක ලස්සන මවපු කඩුපුල් දහවලේ සිල් ගන්න යන්නැති

පිපී ගින්දර පාට දෙන්නැති ඇස පිනන ලස්සන කියන්නැති
කනේරුයි නියඟලා කිව්වම ගොක් කොළද සුදු කොඩි පෙනෙන්නැති

සීතලේ පිපෙනා අවර මල් ලා පාට වුව ලස්සනට ඇති
රාමුවක වටවෙලා රවුමට මනී සොහොනක තනි මකන්නැති

එකී මා කී නොකී හැම මල් පිපී දවසක පරවෙන්න ඇති
පිපී සිටි කළ කරන දේ ගැන සිතා මලකට නමක් දෙන්නැති

සෙ/සී101568
සාසෙ(කා) වීරසිංහ ඕජීඩීපී
2(සෙව්) ශ්‍රීලංසංබ

## ලොවක මහිම...

ලොවක පැසසුම්
නොමැති නම්
සිනාසී නිහඬ වෙන්න
මලක් මොනවාද
ඉල්ලුවේ
සුවඳ දී පරව යන්න

සෙ/487408
ලාකො ලියනආරච්චි එල්ඒඑම්ඒ
10 ගරෙ

## මතකයන්...

ජීවිතයේ මුණගැහෙන
සෑම කෙනෙක්ම
දවසක මතකයන් පමණක්
විය හැකිය...
හැකි සෑම විටම හැම
කෙනෙක්ටම
හොඳ මතකයක් වන්නට
උත්සාහ කරන්න...

සෙ/488786
පාසෙ දිසානායක ඩීඑම්ඩබ්පිසි
16 ගරෙ

## ජීවිතය එහෙමයි...

අද ඔබව වර්ණනා කරන අයම
හෙට ඔබට අපහාස කරාවි
අද ඔබට ආදරේ කරන අයම
හෙට ඔබට වෛර කරාවි
අද ඔබ එක්ක සතුටින් ඉන්න අය
හෙට වෙන අය එක්ක සතුටින් හිඳීවි
පසුතැවෙන්න එපා
මිනිස්සු පුදුමයි
ජීවිතය එහෙමයි

සෙ/523339
කෝප්‍රල් දසනායක ඩීජීසීඑස්
14 විපාරෙ

## නිම නොවන හැඟීමක පහස...

මං ආසම උඹේ ඔය පපු තුරුලේ
උනුහුමට ගුලි වෙන්න
හරි ආදරෙන් ලගට අරගෙන

මං ආසම
උඹේ ඔය උරහිසේ හිස තියන්
රෑ එලිවෙනතුරු කියව කියව ඉන්න

මං ආසම තරහ ගිය වෙලාවට
මං එපාද කියලා නුඹට රිද්දලා
ඕනමයි කියන එක අහන්න

මං ආසම උඹ යන්න ගිහින්
ආයෙමත් ඇවිත්
නලල මත තබන
ඒ ආදරණීය හාදුවේ
පහස විඳගන්න

සෙ/1002324
කෝප්‍රල් දේශප්‍රිය එච්එම්පේ
10 ශ්‍රිලංජාආබමු

## ආදරණීය තාත්තා...

දෑතේ කරගැට සෑදුනත්
ඒවා සිහියට නොගත් තාත්තා
දුප්පත්කම නැතිකරන්න
වෙරදැරූ මගේ තාත්තා
උදයත් දහවලත් රැයක් නොබලා
දුක් වින්දා අපි වෙනුවෙන් තාත්තා
හරිහැටි අහරක් නැතිව කුසගින්නේ
අපි රැක්කා තාත්තා
මගේ අතපය දැඩි කරන්න
රස මසවුලු ගෙන දුන්න තාත්තා
රළු ගතියෙන් සිටියේ නුඹ
අප යහපත් කරන්නද තාත්තේ
ඔබ සිදුකළ ඒ මෙහෙයට
ණය ගැතිවේ මා සදා තාත්තේ
ඒ ණය මට ගෙවා ගන්න
සදා මගේ පියාම වෙන්න තාත්තේ

සෙ/416234
ව/සැරයන් ප්‍රියන්ත ලාල් ඩීජේඩබ්ලිව්අයි
9 ගැහේබ

## මව්පිය සෙනෙහස...

මිහිපිට කොහිද අමිල වූ සෙනෙහසක්
සඳ සිසිලයි අම්මා හිරු එළියයි තාත්තා
ආදරය නිම්හිම් නෑ අනන්තයක් වගෙයි
දූ දරු ලොව සෙනෙහසින් පායා තුන්කල්

ගලායන කරුණා ගුණේ ආදර මෑණියගේ
පපු ගැඹුරේ සැඟවුණු මෙත් ගුණේ පියාගේ
මායාවක් වූ කුරිරු ලොව පෙන්වා දුන්නේ
නුඹලා මිස ලොව අන් කවුරුද තුන් කල්

දිව රෑ දෙකේ නොබලා නෙත නිදි සුවපත්
ජීවිතේ වේදනා උහුලන් මහමෙර උසක්
ආදරයෙන් උණුහුම් කරා සිත් හැමකල්
නැතුවා මව්පිය සෙනෙහස හැර සැපතක්

සෙ/324666
කෝප්‍රල් වීරසිංහ අයිඑන්
11 ශ්‍රීලපාහ

## ඔවදනක්...

කිසිදා වරද නොපිළිගන්නා හා
සෑම විටම වරද
ඔබ වෙත පවරන මිනිසුන්ව
ජීවිතයෙන් ඈත් කරන්න
මන්ද, ඔවුන් නිසා අහිමි වන්නේ
ඔබේ නිහඬ සතුටයි...

සෙ/435147
ලා/කෝ දේශප්‍රිය ටීඑම්අයි
8 ගැහේබ

## අවංක ආදරේ...

නිශ්චිත මුණගැසීම්වලට වඩා
අවිනිශ්චිත මුණගැසීම් ලෙන්ගතුයි
අතින් අත පටලන්
බොරුවට ප්‍රේම කරන අයට වඩා
අතින්වත් නොඅල්ලා
ප්‍රේමර කරන අයගේ
ආදරේ අවංකයි
හුස්ම නතර වෙන තැන්වලට වඩා
හුස්ම අමතක වෙන තැන්
හරි සුන්දරයි

සෙ/435194
ලා/කෝ ප්‍රියන්ත ඒඑම්
8 ගැහේබ

## ආදරය...

ගංදෑල පාමුල පිපෙන රුක් අත්තන
මලේ හැඩ වැනිය ඔය මුවේ සිනහව
වළලු බැඳි දෑතින් මගේ හිස පිරිමදින
විට නුඹේ කෙහෙරැලි
මුවෙහි මගේ දැවටෙන
තරමටම ලංවෙලා නෙතු නුඹේ යාවෙලා
හැඟේ මට නුඹ මලයි මගේ සිත පිපුන
නොදැක මට ඉවසන්න
නුඹෙන් තොර මේ දිවිය
දරාගත නොහැක මට
මේ කටුක ජීවිතය
නොලැබුණොත් නුඹ මෙමට
අවසරයි මියැදෙන්න

සෙ/527939
කෝප්‍රල් පුෂ්ප කුමාර පීඑච්යූ
14 විපාරෙ

## දෙවැනි බුදුන් අම්මා...

දස මසක් කුස දරා
මහ මෙරක් දුක දරා
මා මෙලොවට එක දිනක
බිහිකළ මගේ මව්නි

දරා සෑම වේදනා
මා මෙලොවට බිහි කලාට
දණ නමා මා වඳිමි
මගේ අම්මේ

දුක සතුට දෙක මැද
එකට සිට මගේ මව්නි
පතමි සැමදා මගේ සතුටම
මම අම්මේ

සෙ/488786
පාසෙ දිසානායක ඩීඑම්ඩබ්ලිව්ජීසී
16 ගරෙ

## සෙබළ සම්පත්...

ඈත අහසේ දිදුලන තරු කැට සේ
ඔබේ නෙත් යුග දිලිසේ
ඔබේ නෙතඟින් වැටෙන කඳුළු
හෙමිහිට පොළවට මුසු වේ
අතේ අවි ඇතත් ඉතින්
ඔබේ හිතේ නැත අවියක්
ඇත්තේ එක අරමුණකුයි
රට රැකුමට ඔබේ දිවියෙන්

සෙ/474093
කෝප්‍රල් සම්පත් එච්එල්පී
6 ගරෙ

## සතුට හා කඳුල...

මේ ගමන් තුළ හමුවන සමුගත්ත
සෑම අයෙකුම
ජීවිතේට අත්දැකීමක් එක්කරනවා විනා
ඒ හමුවීම් සමුගැනීම් හේතුවෙන්
අපි විඳින සතුට හා කඳුල
තව තවත් අපිට ශක්තිමත් කරන්නේ
ජීවිතය යථාර්ථය
මැනවින් වටහාගන්න
අවස්ථාවකුත් උදාකරමින්මයි...

සෙ/ආර්102561
සාසෙ සාවින්දි ඩබ්ලිව්ජීපී

## රණවිරුවා...

නැති වුනත් මව්බිමේ අඟලක්
තමන්ගේ යැයි කීමට
නුඹයි හැම බිම් අඟලක්ම
නිදහස් කලේ ලක් මෑණිට
ජීවිතේ හැම දේවල්
අහිමි වූවත් ඔබ හට
දිවි පරදුකොට සටන් කෙරුවේ
ලක් මවුන් රැක ගැනුමට

සෙ/651026
ලා/කෝ බංඩාර එච්එම්එස්
රණවිරු සෙවන - රාගම

## නිස්සාර හදවත...

හදවතම කර්කශ්ට වී
දුකම නියඟෙට අත වැනුව
ඉරි තැලුන හදවතට
තෙත ගතිය ඇති වෙන්න
වැහි බිංදු සේ සතුට
නොවැටේද හදවතම තෙත් වෙන්න
නිස්සාර මේ හිතට
පන මදිලූ හිනැහෙන්න

සෙ/602996
බනි 11 බංඩාර ඊඑම්එස්
3 ශ්‍රීලයුයුබ

# "සීෂෙල්ස් නිදහස් දින බොක්සිං තරඟාවලිය"

"සීෂෙල්ස් නිදහස් දින බොක්සිං තරඟාවලිය" ඉකුත් ජූනි මස 16 වන දින සිට 26 වන දින දක්වා සීෂෙල්ස් රාජ්‍යයේදී පැවති අතර, ඒ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශිෂ්ට දස්කම් දැක්වූහ. එහිදී, කිලෝග්‍රෑම් 67 බර පන්තිය නියෝජනය කරමින් එක්වූ විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රනාන්දු පීඑස්පීඑස් තරඟාවලිය පුරාවටම දස්කම් දක්වමින් රන් පදක්කමක් දිනාගැනීමට සමත්විය. එමෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ සැරයන් පද්මසිරි කේජීසී කිලෝග්‍රෑම් 75 බර පන්තිය නියෝජනය කරමින් රිදී පදක්කමක් දිනාගනිමින් ජාත්‍යන්තර තලය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා නාමය බබළවීමට සමත්විය.










# 14 වන පාබල සේනාංක වොලිබෝල් තරඟාවලය



14 වන පාබල සේනාංකය මගින් සංවිධානය කරන ලද " අභියෝගතා කුසලාන වොලිබෝල් තරඟාවලිය - 2024" කැලණිමුල්ල 2 (සෙව්) පාබල හමුදා ක්‍රීඩා පිටියේදී ඉකුත් ජූලි මස 9 වන දින සිට 12 වන දින දක්වා පැවැත්විණ. බලසේනා සහ බළඇණිවල කණ්ඩායම් 18 ක සහභාගීත්වයෙන් පැවති මෙම තරඟාවලියට ප්‍රධාන අමුත්තා ලෙස 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ්ඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී සහභාගී විය. එහිදී, කණ්ඩායම් අතර උණුසුම් තරඟ වට කිහිපයකින් අනතුරුව 9 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව ශූරතාව දිනාගැනීමට සමත් විය.





# 102 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය

ශ්‍රී ලංකා මලල ක්‍රීඩා කමිටුව විසින් සංවිධානය කළ "102 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලිය" පසුගියදා නිමාවට පත්විය. දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී ඉකුත් ජූනි මස 25 සිට 27 වන දින දක්වා පැවති මෙම ශූරතාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් ද ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 250 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ.

එහිදී, ජවන හා පිටිය ඉසව්වල ජයග්‍රහණ රැසක් හිමිකර ගනිමින් එහි සමස්ත ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමත්විය. තරඟාවලියේ දී යුද්ධ හමුදාව දිනාගත් ජයග්‍රහණ පහත දැක්වේ.

**හෙල්ල විසිකිරීම ප්‍රථම ස්ථානය (පිරිමි)** - කෝප්‍රල් රණසිංහ ආර්එම් - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

**උස පැනීම පළමු ස්ථානය** - ලාන්ස් බොම්බොඩියර් දසුන් එස්ජ්ටී - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

**තුන් පිම්ම පළමු ස්ථානය** - ආධුනික සෙබළ යසිරු කේඑම් - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය

**මීටර් 400 (පිරිමි) පළමු ස්ථානය** - මාණ්ඩලික සැරයන් දර්ශන එස්ජ් - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

**වෛද්‍ය එන් එදිරිවීරසිංහම් අභියෝගතා කුසලානය** - උස පැනීම - පළමු ස්ථානය - ලාන්ස් බොම්බොඩියර් දසුන් එස්ජ්ටී - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

**මීටර් 400 (කාන්තා) පළමු ස්ථානය** - මාණ්ඩලික සැරයන් නදීෂා ආර් - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

**මීටර් 1000 (කාන්තා) පළමු ස්ථානය** - කාන්තා සෙබළ විජේසූරිය ඩබ්ලිව්ජ්එම්ආර් - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

**මීටර් 100 කඩුළු මතින් දිවීම (කාන්තා)** - පළමු ස්ථානය - සැරයන් සුගන්ධි ඩබ්ලිව්වීඑල් - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

**හෙල්ල විසි කිරීම පළමු ස්ථානය (කාන්තා)** - මාණ්ඩලික සැරයන් ලේකම්ගේ එච්එල්එන්ඩී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

**මීටර් 800 (පිරිමි) පළමු ස්ථානය** - සාමාන්‍ය සෙබළ කරුණාරත්න - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය

**දක්ෂතම තුන් ඉරියව් ක්‍රීඩකයා** - මාණ්ඩලික සැරයන් දර්ශන එස්ජ් - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

# 56 වන පාබල සේනාංක වොලිබෝල් තරඟාවලිය

56 වන පාබල සේනාංකය සහ එම සේනාංකය යටතේ ස්ථාපිත බලසේනා සහ බළඇණිවල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ජූලි මස 02 වන දින වොලිබෝල් තරඟාවලියක් පැවැත්විණි.

56 වන පාබල සේනාංක ක්‍රීඩා පිටියේ පැවති එම තරඟාවලියේ අවසන් මහා තරඟයේදී 7 සහ 16 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඒකක තරඟවැදුණු අතර, එහිදී තියුණු තරඟයකින් අනතුරුව ජයග්‍රහණය දිනාගැනීමට 7 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සමත්විය.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගි වූ අතර, තරඟාවලිය නැරඹීම සඳහා නිලධාරීන් සහ සෙසුනිලයන් විශාල පිරිසක් ද එක්වූහ.



## මානව හිමිකම් හා මානුෂවාදී නීතිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව අංක 35 - සෙසුනිල





කුකුලේගඟ සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය මඟින් පවත්වන ලද මානව හිමිකම් හා මානුෂවාදී නීතිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව අංක 35 - සෙසුනිල ඉකුත් ජූලි මස 26 වන දින සාර්ථකව අවසන් විය. නීති සේවා, මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම යටතේ ත්‍රිවිධ හමුදාවේ සෙසු නිලයන් 31 දෙනකුගේ සහභාගීත්වයෙන් 2024 ජූලි මස 08 වන දින සිට ජූලි මස 26 වන දක්වා එය පැවැත්විණ. පාඨමාලාවේ සමාප්ති දේශනය සඳහා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජ් හෙට්ටිගේ ආර්එස්පී පීඑස්සී සහ නීති සේවා, මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ කර්නල් එන්එස් නල්ලපෙරුම යූඑස්පී එන්ඩීසී සහභාගී වූහ.







# රණවිරුවා





**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේඑච්එන් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
පීපීඑන් ද සා
ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ භවත්ති

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බති II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජ්එම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# එක්සත් ජාතීන්ගේ සේවයේ නියුතුව සිටි ආරක්ෂක හමුදා දෙවන කණ්ඩායම දිවයිනට





මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායිතාවය ඇතිකිරීමේ මෙහෙයුම් මූලස්ථානය (*MINUSMA*) යටතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා දෙවන හට කණ්ඩායම සිය රාජකාරි නිමාවෙන් පසුව ඉකුත් ජූලි මස 23 වන දින මව්බිමට පැමිණියහ. ඒ අනුව, එලෙස දිවයිනට පැමිණි කණ්ඩායමට යුද්ධ හමුදා නිලධාරින් 13 දෙනෙක් සහ සෙසුනිලයෝ 90 දෙනෙක් සමගින් 103 දෙනෙක් ඇතුළත් වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එස්ජ්එන්ඩී එදිරිසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සී ඇතුළු නිලධාරීහු ගුවන් තොටුපළ පරිශ්‍රය වෙත සපැමිණි මෙම පිරිස උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.

2017 වර්ෂයේ සිට මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරීන්හි නිරතව සිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා භටපිරිස් විසින් මව්බිම වෙනුවෙන් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දී ජාතික සංවර්ධනයට ලබාදී ඇති දායකත්වය අති මහත්ය.





රණබිමේ මතක

## පොළොව උඩ ජීවිත රකින්නට
## පොළොව යට ගෙවූ ජීවිත

යුද්ද කාලෙ අපේ රණවිරුවෝ පොළොව මතුපිට විතරක් නෙවෙයි පොළොව යටත් ජීවිතේ ගෙව්වා. ඒක කොයිතරම් දුෂ්කර උනත් කටුක උනත් වැඩි පිරිසකගෙ ජීවිත රැකුනෙම ඒ නිසයි. අද ලක් පොළොව මත හැමෝටම නිදහසේ පය තබන්නත්, සැනසිල්ලෙ හුස්මක් ගන්නත්, ඉඩ ලැබිල තියෙන්නෙම එදවස මහපොළොව යට ඉඳනුත් මේ රට රැකපු පිරිසක් හිටිය නිසයි. යුද බිමේ පයගහපු කාටවත් මේ පොළව යට බංකරේ (*Underground Bunker*) දකිනකොට ඒ මතක අමතක වෙන්න විදියක් නැහැ.

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.